# මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව

## 2022 ජනවාරි 20 වන දින

❖ 08 වන සැසි වාරයේ 45 වන සභා වාර්තාව

දිනය :- 2022.01.20 වන දින

වේලාව :- පෙ.ව.10.00

ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මීද්දෙණිය

පැමිණීම

| | |
|---|---|
| 01. ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02.ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 04. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 05. ගරු ප්‍රා.ස.ම කේ.සුනිල් ශාන්ත කුමාර | පෙ.ව. 10.00 |
| 06. ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සහන් චන්ද්‍ර කුමාර් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 07. ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත ජයලත් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 08. ගරු ප්‍රා. ස. ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා | පෙ.ව. 10.00 |
| 09. ගරු ප්‍රා.ස.ම. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 10.ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 11. ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ප්‍රදීපා නියංසලා මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 12. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඒ. සංජීව මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 13. ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 14. ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 15. ගරු ප්‍රා.ස.ම. ඩී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 16. ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා. | පෙ.ව. 10.00 |

| | |
|---|---|
| 17. ගරු ප්‍රා.ස.ම.එච්.කේ.ඒ ආනන්ද කුලසුන්දර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 18. ගරු ප්‍රා.ස.ම. සුගත් සරණගේ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 19. ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා | පෙ.ව. 10.00 |
| 20. ගරු ප්‍රා.ස.ම. එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 21.ගරු ප්‍රා.ස.ම. රමනී හල්පෙ ගමගේ මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 22. ගරු ප්‍රා.ස.ම. සිරිසේන පෙහෙට්ටිගේ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 23. ගරු ප්‍රා.ස.ම. එන්.ජී.එස්. විරසිරි මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 24. ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 25.ගරු ප්‍රා.ස.ම. අයි.කේ. සුසන්ත පද්ම තිලක් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 26. ගරු ප්‍රා.ස.ම. ටී.බී. ඉන්දික මැතිතුමා. | පෙ.ව. 10.00 |

**<u>නොපැමිණීම</u>**

01. ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා
02. ගරු ප්‍රා.ස.ම. කේ. රන්ජන් විරසේකර මැතිතුමා.

**<u>සහභාගී වූ නිලධාරීන්</u>**

01. ලේකම් (වැ.බ) - එම්.දිනුජිත් රත්නපාල මයා.
02. කළමනාකරණ සේවා නිළධාරී - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

**<u>ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණි සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන් සියළු දෙනා මෙන්ම සහභාගි වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදි. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

සියළු දෙනාටම සුබ උදෑසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. 2022 වර්ෂයේ ජනවාරි මාසයේ මහා සභා රැස්වීම තමයි අද පැවැත්වෙන්නේ. අද දින කටුවන ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ දෙසැම්බර් මස මහ සභා රැස්වීම සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමන්, හිටපු සභාපතිතුමන් , මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු

ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගී වූ ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමියන්, මාධ්‍යවේදී තුමන්ලත් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරනු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

## 01. පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.

2021 දෙසැම්බර් මස 23 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියවේවා යේ සළකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

ගරු ප්‍රා.ස.ම.ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මම මෙම වාර්තාවේ සංශෝධන කිහිපයක් කරන්න කැමතියි. 32 පිටුවෙහි මගේ ප්‍රකාශය තුළ සියලු දෙනාගෙන්ම අවසරයි වෙනුවට ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාගෙන් අවසරයි කියලා සංශෝධනය විය යුතුයි. ඒත් එක්කම ආරවුලක් සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාවක් කර ගන්නවා ලෙසත් එය ඉදිරිපත් කරන්නේ සාධාරණයක් ඉටුකර ගැනීමේ බලාපොරොත්තුවෙන් ලෙසත් මෙම මාර්ගය අඩි 8ක් පමණ පළලට කොන්ක්‍රීට් කරලා තියෙනවා ලෙසත් සංශෝදනය විය යුතුයි. ඒත් එක්කම තාක්ෂණ නිළධාරී විසින් ලබා දුන් නිර්දේශය වැරදියි ලෙසත් ඒ සදහා කමිටුවක් පත් කරලා නැවත සොයා බලන්න ලෙසත් සංශෝදනය කළ යුතුයි.

**ගරු සභාපති අයි.පී. මහින්ද මැතිතුමා**

එම ස්ථාන සංශෝදනය කරන්න.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මෙම කාරණාව සම්බන්ධව පත් කරන ලද කමිටුවට ගරු ප්‍රා.ස.ම. කේ.රන්ජන් වීරසේකර මැතිතුමන් ඇතුළත් කිරීමට අපි යෝජනා කර ගත්තා නේද? මම හිතන්නේ එතුමන් ඒ සදහා ඇතුළත් කරමු. ඒ අනුව එම කමිටුව මගින් සාකච්ඡා කරලා තීරණයක් ලබා ගනිමු.

**ගරු සභාපති අයි.පී. මහින්ද මැතිතුමා**

ඔව්. එතුමන්ව මේ කමිටුව සදහා ඇතුළත් කරන්න.

ඒ අනුව සංශෝදන සහිත වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021 දෙසැම්බර් මස 23 වන දින පැවති මහ සභා රැස්වීමේ සංශෝදිත වාර්තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත

**03. ප්‍රාදේශීය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා සන්නිවේදන**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** - නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05 – 1.කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කටුවන කලාපයේ කඩ කාමර වල දඩ මුදල් අත් හැරීම සම්බන්ධව**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු මුදල් අත් හැරීම සදහා විධිමත් සභා සම්මුතියක් හා ගරු ආණ්ඩුකාර අනුමැතිය ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස 06 හා 2022.01.06 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපිය හා බැදේ. එහි සදහන් පරිදි කටුවන කලාපයේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් 2021 ජුලි මාසය සදහා කටුවන කලාපයේ කඩ කාමර වල දඩ මුදල රු.4265.00ක් ලෙස අත්හැරීම සදහා ගණනය කිරීම සිදු කර ඇති අතර එම මුදල ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ආණ්ඩුකාර අනුමැතිය මත කපා හැරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඒ.සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මෙම කටුවන, හීරම , මීද්දෙනිය කඩ කාමර කුලී හා ටෙන්ඩර් දේපල බදු මුදල් අත් හැරීම සම්බන්ධයෙන් විවිධාකාර යෝජනා කිහිපයක් මෙහි ඇතුළත් වෙනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඔව්, ඒ සම්බන්ධයෙන් වෙන වෙනම විධිමත්ව තීරණ ලබා ගෙන ගරු ආණ්ඩුකාරතුමන් වෙත දන්වා යැවීම අවශ්‍යයි. ඒ නිසා තමයි යෝජනා කිහිපයක් යටතේ ඇතුළත් කරලා තියෙන්නේ. අපි ඒ සියලු ගණනය කරන ලද මුදල් අත් හැරීමට යෝජනා කරනවා.

ඒ අනුව කටුවන කලාපයේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් 2021 ජුලි මාසය සදහා කටුවන කලාපයේ කඩ කාමර වල දඩ මුදල රු.4265.00ක් ලෙස අත්හැරීම සදහා ගණනය කිරීම සිදු කර ඇති අතර එම මුදල ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ආණ්ඩුකාර අනුමැතිය මත කපා

ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 2. පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

පුස්තකාල පොත් මිලදී ගැනීම මැයෙන් අංක කප්‍රාප 10 හා 2021.01.10 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව මහරගම, දම්මජෝත පාර, 14/5 , සමන් උයන ලිපිනයෙහි පදිංචි මහාචාර්ය ඉන්ද්‍රාණි මුණසිංහ මහත්මිය විසින් රචිත කිතර පෝය බෞද්ධාගමික වැදගත්කම , උඳුවප් පෝය බෞද්ධාගමික වැදගත්කම , දුරුතු පෝය බෞද්ධාගමික වැදගත්කම යන කෘති තුනෙන් පිටපත් දෙක බැගින් පුස්තකාල 4 සඳහා පිටපත් 24ක්ද ආචාර්ය ගාමිණී කාරියවසම් මහතා විසින් රචිත සාරස පුවත් ලිපි සරණිය කෘතියෙන් පිටපත් දෙක බැගින් පුස්තකාල හතර සඳහා පිටපත් 8ක්ද සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

මේ පොත් වල පිටපතක් සාම්පල ලෙස එවීම හොඳක් වටිනවා. අපිට කෘතිය පිළිබඳ තීරණයක් ගන්න පුළුවන්. කෙසේ නමුත් අපි මේ ලේඛකයාට අත දීමක් ලෙස මෙම කෘති මිලදී ගනිමු.

ඒ අනුව කිතර පෝය බෞද්ධාගමික වැදගත්කම , උඳුවප් පෝය බෞද්ධාගමික වැදගත්කම , දුරුතු පෝය බෞද්ධාගමික වැදගත්කම යන කෘති තුනෙන් පිටපත් දෙක බැගින් පුස්තකාල 4 සඳහා පිටපත් 24ක්ද සාරස පුවත් ලිපි සරණිය කෘතියෙන් පිටපත් දෙක බැගින් පුස්තකාල හතර සඳහා පිටපත් 8ක්ද සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 3. ජල ව්‍යාපෘතියේ ජලය පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධව

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ජල ව්‍යාපෘතියේ ජලය පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාප 10 හා 2021.12.27 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ප්‍රාදේශීය සභා ජල ව්‍යාපෘතියේ අඹවත්ත ප්‍රධාන ජල සැපයුම් පද්ධතියේ පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය අක්‍රිය වීම හේතුවෙන් අළුතින් වැලි දැමීම සඳහා අවශ්‍ය වැලි සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

මේ කටයුත්ත සිදු කරන්නේ තාක්ෂණ නිළධාරීන්ගේ නිර්දේශය මත නේද ?

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ඔව්, මේ සඳහා ගඟේ වැලි තමයි යොදන්නේ. දැනට වැලි ගෙනත් තියෙනවා. ඒ සඳහා ගෙවීම් කරන්න අවශ්‍යයි. ඒත් එක්කම ජල පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය අක්‍රිය වීම නිසා අලුතින් වැලි යොදන්න වෙනවා. ඒ ක්‍රියාවලිය ක්‍රමවත්ව කරන්න ඕන.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා

ඒත් එක්කම සභාපතිතුමනි, පසුගිය දවසක මහින්ද නාහිමි මාවතෙහි ඇති වූ ජල සැපයුම් බිඳ වැටීම සම්බන්ධයෙන් නැවත යථා තත්වයට පත් කරන්න දින කිහිපයක් ගත වුණා. එතකොට දෝෂාරෝපණය එන්නේ සභාවට. මොකද මිනිස්සු ජලය අපතේ යාම දකින්නේ සභාව මේ පිළිබඳ සැලකිල්ලක් දක්වන්නේ නැති ලෙස.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ඒ කාරණයේදී අපේ JCB යන්ත්‍රය අක්‍රිය වෙලා තිබුණේ. නමුත් අපි සේවකයින්ට පඩි ගෙවමින් , අතිකාල ගෙවමින් විශාල පිරිසක් මේ කටයුතු සඳහා යොදවා තිබෙනවා. ජල සම්පාදන මණ්ඩලයේ සේවකයින් සියලු කාර්යයන් තමන්ගේ ශ්‍රමයෙන් තමයි කරන්නේ. ඒ අය ජල සැපයුම් බිඳ වැටීම් වලදී විශාල වළවල් හාරනවා. ඒ සියල්ල කරන්නේ තමන්ගේ ශ්‍රමයෙන්. මම අපේ සේවකයින්ටත් මේ කටයුත්තේදී තමන්ගේ ශ්‍රමය පාවිච්චි කරන්න කිව්වා. එහෙම නැත්නම් එක කාර්යයක් සඳහා විශාල පිරිසක් බලාගෙන ඉන්නවා. මහාරච්චිත්ත , මුකන්දයාය ජල බලාගාරය අසල පසුගිය දිනක එවැනි සිදුවීමක් වුණා. සේවකයින් බලා සිටියදී මම ඒ කාර්යය සඳහා මැදිහත් වුණා.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා

ඒ කාරණව ඇත්ත. අපි සියලු සේවකයින් සඳහා අවශ්‍ය සියලු පහසුකම් දීලා තියෙනවා. ඒ අයට තියෙන්නේ වැඩ ටික කරන්න. ඔබතුමන් කියන දේ හරි. නමුත් නගරායත්තනයේ එවැනි ජල බිදවැටීමක් වුවහොත් ඒ සඳහා කුලියට හෝ යන්ත්‍රයක් සහ අවශ්‍ය උපකරණ ලබා ගෙන කඩිනමින් ඒ කාර්යය කරලා දෙන්න. නගරායත්තනයේ එවැනි බිඳ වැටීමක් සඳහා විශාල කාලයක් ගත කරන එක සුදුසු නැති බව තමයි මගේ අදහස.

ඒ අනුව ප්‍රාදේශීය සභා ජල ව්‍යාපෘතියේ අඹවත්ත ප්‍රධාන ජල සැපයුම් පද්ධතියේ පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය අක්‍රිය වීම හේතුවෙන් අළුතින් වැලි දැමීම සඳහා අවශ්‍ය වැලි සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විමංසිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

05 – 4. කටුවන, මිද්දෙනිය, කිරම කඩ කාමර කුලී අත් හැරීම සම්බන්ධව ( 2021 සැප්තැම්බර් මාසය සඳහා)

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු මුදල් අත් හැරීම සඳහා විධිමත් සභා සම්මුතියක් හා ගරු ආණ්ඩුකාර අනුමැතිය ලබා ගැනීම - කඩ කාමර කුලී මිද්දෙනිය, කටුවන, කිරම කලාප මැයෙන් අංක කප්‍රාප 06 හා 2022.01.11 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපිය හා බැඳේ. එහි සඳහන් පරිදි

01. පළාත් පාලන කොමසාරිස්ගේ අංක 04/04/9/01 හා 2021.12.31 දිනැතිව අප වෙත එවා ඇති ලිපිය පාදක කර ගනිමින් මිද්දෙනිය ,කටුවන, කිරම යන කලාපවල කඩ කාමර වලින් ගණනය කර ඇති අත්හරිනු ලබන මුදල රු. 425088.27ක මුදල අත් හැරීම සුදුසු බවත්

02.2021 සැප්තැම්බර් මාසය සඳහා දැනටමත් කඩ කාමර කුලී ගෙවා ඇති බදුකරුවන්ගේ මුදල් ඉදිරි මාසය සඳහා හිලව් කිරීම සුදුසු බවත්

03.මිද්දෙනිය මහජන බැංකුව පවත්වා ගෙන යන රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 01 සිට 08 දක්වා කඩ කාමර , අංක 12 කඩ කාමරය හා ස්වයං බැංකු ඒකකය යනාදිය එම කාලය තුළ පවත්වා ගෙන ගිය බැවින් ඒ සඳහා බදු මුදල් අය කිරීම සුදුසු බවත් යෝජනා විය.

ගරු ප්‍රා.ස.ම.පී.කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා

ගරු සභාපතිතුමණි, මේ වාර්තා පරීක්ෂා කිරීමේදී අපිට පේන කරුණක් විදියට මහජන බැංකුවට සහ ස්වයං බැංකු ඒකකයට අයත් කඩ කාමර වල කුලී මුදල් අපි අත් හැරිය යුතු නැහැ. මොකද මෙම කාල සීමාව තුළ එම ආයතන සුපුරුදු පරිදි පවත්වා ගෙන ගියා. ඒත් එක්කම ඇතැම් කඩ කාමර විශේෂයෙන්ම රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ දෙවන මහල ආදිය කොරෝනා තත්වය නොමැති කාලයේ වුවත් වසා දමලා තිබුණා. ඒ අයට විශේෂ සහනයක් දෙන්න අවශ්‍ය නැති බව තමයි මගේ අදහස. ඒ ගැනත් හිතන්න වෙනවා. අනෙක් බදු හිමියන් තමන් කර ගෙන ගිය ව්‍යාපාර වලින් පාඩු ලැබූ නිසා තමයි ඉල්ලීමක් කරලා තියෙන්නේ. ඒ අයට ඒ සහනය ලබා දෙමු. නමුත් අපිත් සමඟ ගිවිසුම් ගත වී වසර ගණනක් වසා ඇති කඩ කාමර සඳහා අපි සහන දෙන්න අවශ්‍ය නැහැ.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

මහජන බැංකුවට අයත් කඩ කාමර සඳහා අපි බදු අය කිරීම් කරනවා. අනෙක් කාරණය පිළිබඳවත් පරීක්ෂා කරලා සලකා බලමු. අපි අනෙක් කඩ හිමියන් සඳහා අදාළ කාල සීමාවන් වල සහන ලබා දෙමු.

ඒ අනුව

01. පළාත් පාලන කොමසාරිස්ගේ අංක 04/04/9/01 හා 2021.12.31 දිනැතිව අප වෙත එවා ඇති ලිපිය පාදක කර ගනිමින් මිද්දෙනිය ,කටුවන, හිරම යන කලාපවල කඩ කාමර වලින් ගණනය කර ඇති අත්හරිනු ලබන මුදල රු. 425088.27ක මුදල අත් හැරීම සම්බන්ධවත්

02.2021 සැප්තැම්බර් මාසය සඳහා දැනටමත් කඩ කාමර කුලී ගෙවා ඇති බදුකරුවන්ගේ මුදල් ඉදිරි මාසය සඳහා හිලව් කිරීම සම්බන්ධවත්

03.මිද්දෙනිය මහජන බැංකුව පවත්වා ගෙන යන රාජපක්ෂ සුසිරි වෙළඳ සංකීර්ණයේ අංක 01 සිට 08 දක්වා කඩ කාමර , අංක 12 කඩ කාමරය හා ස්වයං බැංකු ඒකකය යනාදිය එම කාලය තුළ පවත්වා ගෙන ගිය බැවින් ඒ සඳහා බදු මුදල් අය කිරීම සම්බන්ධවත්

විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකමතිකාවය මත ඒකමතිකව සභා සම්මත විය.

05 – 5. කටුවන ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව බදු දී ඇති දේපල අතරින් පාඩු ලබන දේපල වල ටෙන්ඩර් ආදායම අත් හැරීම සම්බන්ධව ( 2021.08.21 දින සිට 2021.09.30 දක්වා )

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු මුදල් අත් හැරීම සඳහා විධිමත් සභා සම්මුතියක් ලබා ගැනීම් මැයෙන් අංක සාප්‍රාස 06 හා 2022.01.11 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපිය හා බැඳේ.

ඒ අනුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක 4/04/09/01 හා 2021.12.31 දිනැතිව අප වෙත එවා ඇති ලිපියට අනුව කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කටුවන ප්‍රාදේශීය සභාව විසින් බදු දී ඇති දේපල වලින් ටෙන්ඩර්කරුවන් පාඩු ලබන දේපල වෙනුවෙන් අත් හැරීම සඳහා ගණනය කරන ලද රු. 36448.00 ක මුදල (2021.08.21 දින සිට 2021.09.30 දින දක්වා) කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා දී ඇති බැවින් එම මුදල අත්හැරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රා.ස.ම.පී.කොඩිතුවක්කු මැතිතුමා</u>

අපි ඒ ටෙන්ඩර් කරුවන්ට සහනයක් ලබා දෙමු.

ඒ අනුව කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කටුවන ප්‍රාදේශීය සභාව විසින් බදු දී ඇති දේපල වලින් ටෙන්ඩර්කරුවන් පාඩු ලබන දේපල වෙනුවෙන් අත් හැරීම සඳහා ගණනය කරන ලද රු. 36448.00 ක මුදල (2021.08.21 දින සිට 2021.09.30 දින දක්වා) කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා දී ඇති බැවින් එම මුදල අත්හැරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

<u>05 – 6. කටුවන ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව බදු දී ඇති දේපල අතරින් පාඩු ලබන දේපල වල ටෙන්ඩර් ආදායම අත් හැරීම සම්බන්ධව ( 2021.08.01 දින සිට 2021.08.20 දක්වා )</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු මුදල් අත් හැරීම සඳහා විධිමත් සභා සම්මුතියක් ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස 06 හා 2022.01.11 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපිය හා බැඳේ.

එහි සඳහන් පරිදි කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කටුවන ප්‍රාදේශීය සභාව විසින් බදු දී ඇති දේපල වලින් ටෙන්ඩර්කරුවන් පාඩු ලබන දේපල වෙනුවෙන් 2021.08.01 දින සිට 2021.08.20 දින දක්වා අය කිරීම සිදු කළ යුතු අතර ඉහත දේපල සඳහා ලබා දී ඇති සභා තීරණ පදනම් කරගෙන මුදලින් කොටසක් අය කර ඇති බැවින් තව දුරටත් එම කාල වකවානුවට අදාළව සභා තීරණ මත අත්හැරිය යුතු රු. 7374.25 ක මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය සඳහා යොමු කර කපා හැරීම සිදුකිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කටුවන ප්‍රාදේශීය සභාව විසින් බදු දී ඇති දේපල වලින් ටෙන්ඩර්කරුවන් පාඩු ලබන දේපල වෙනුවෙන් 2021.08.01 දින සිට 2021.08.20 දින දක්වා අය කිරීම සිදු කළ යුතු අතර ඉහත දේපල සඳහා ලබා දී ඇති සභා තීරණ පදනම් කරගෙන මුදලින් කොටසක් අය කර ඇති බැවින් තව දුරටත් එම කාල වකවානුවට අදාළව සභා තීරණ මත අත්හැරිය යුතු රු. 7374.25 ක මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය සඳහා යොමු

කර කපා හැරීම සිදුකිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 7. 2022 වර්ෂයට අදාළව මාර්ග සංවර්ධන යෝජනා ඇතුළත් කිරීම

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා**

2022 වර්ෂයට අදාලව ඉදිරිපත් කිරීමට නියමිත අයවැය යෝජනා සඳහා මිද්දෙනිය නැගෙනහිර නුගේ අසළින් පෝක්ක වත්ත රක්ෂිතය මගින් වෙන්වන ගම් මායිම් පාර සංවර්ධනය කිරීම සුදුසු යයි යෝජනා කරමි.

මෙම මාර්ගයේ ඉතිරි කොටස ගිය වර්ෂයේ ප්‍රතිපාදන මගින් සංවර්ධනය කළා. මේ කොටසත් සංවර්ධනය කිරීමෙන් පසු මාර්ගය සම්පූර්ණ වෙනවා.

ගරු ප්‍රා.ස.ම.ඊ.බී.ඉන්දික මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි තාක්ෂණ නිළධාරි මහතෙකු මගින් ඇස්තමේන්තුවක් සකස් කර ගනිමින් හදමු. මේ මාර්ගය සකස් කිරීම අපේ කොම්පෝස්ට් අංගනය සඳහා යාමටත් පහසු වෙනවා.

[illegible] 2022 වර්ෂයට අදාළ [illegible] මිද්දෙනිය නැගෙනහිර නුගේ අසළින් පෝක්ක වත්ත රක්ෂිතය මගින් වෙන්වන ගම් මායිම් පාර සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණ නිළධාරින් ලවා ඇස්තමේන්තු සකස් කර සභා අරමුදලින් සංවර්ධනය කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 8. සභා නඩු සඳහා නීතිඥ මහතෙකු තෝරා ගැනීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සභා නඩු සඳහා නීතිඥ මහතෙකු තෝරා ගැනීම සම්බන්ධවයි මැයෙන් ආදායම් පරීක්ෂක එම්.කේ.ටී.ටකුරිකා මිය විසින් 2022 .01.12 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශීය සභාවේ ඉදිරි නඩුකටයුතු සඳහා වලස්මුල්ල අධිකරණයේ නීතිඥ දයාරත්න වීරසිංහ මහතා සුදුසු බවත් ඉදිරි නඩු කටයුතු එතුමන් හට භාරදීම සුදුසු බව යෝජනා කරමි.

ගරු [illegible] මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මීට පෙර අපේ සභාවේ නඩු කටයුතු සඳහා පෙනී සිටියේ නීතිඥ මද්දුම ලියනගේ මහතා පසුගිය දවසක අපේ නඩු කටයුත්තක් සඳහා එතුමා මගින් නඩු දාන්න යද්දි එතුමා එම පාර්ශවයද හඳුනන බව කියමින් එය ප්‍රතික්ෂේප කරලා තිබුණා. ඒ නිසා තමයි අපි ඉදිරි නඩු කටයුතු සඳහා පළාත් පාලනය සඳහා පෙනී සිටින වෙනත් නීතිඥ මහතෙකු තෝරා ගන්න තීරණය කළේ.

<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා</u>

සභාපතිතුමණි, අපේ සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරයෙක් නීතිඥ මහතෙක් ලෙස වෘත්තීමය වශයෙන් කටයුතු කරනවා. එතුමා මේ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට යොදා ගන්න බැරිද? කොහොම නමුත් අපි තෝරා ගන්නා ලද නීතිඥ මහතා වෙත සභාව සතු සියලුම නඩු පෙන්වා දීලා ඒවා ඉක්මණින් අවසන් කරලා දෙන්න අපේ සහයෝගය ලබා දෙන්න ඕන.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

එතුමා සභාවේ නඩු කටයුතු සඳහා යොදා ගන්න බැහැ. එතුමා මගින් නීතිඥ මහතෙකු තෝරා ගන්න පුළුවන්. අපි ඒ සම්බන්ධව විමසීමක් කරන්න ආදායම් පරීක්ෂක තුමිය වෙත පවරමු.

<u>ගරු ප්‍රා.ස.ම.එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේ සඳහා නම් කරන ලද නීතිඥ මහත්වරු සිටිනවද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

එහෙම නැහැ. නමුත් විවිධ විෂයන් යටතේ පෙනී සිටින නීතිඥ මහත්වරු සිටිනවා. පළාත් පාලනය සම්බන්ධ නඩු කටයුතු සඳහා වෙනත් ප්‍රාදේශීය සභාවන් වල නඩු සඳහා වලස්මුල්ල අධිකරණයේ නීතිඥ දයාරත්න වීරසිංහ මහතා පෙනී සිටිනවා. ඒ නිසා තමයි අපි එතුමන්ව යෝජනා කළේ.

<u>ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මෙම නීතිඥ මද්දුම ලියනගේ මහතා අපි සමග සභාවේ නඩු සඳහා පෙනී සිටීමට යම් ගිවිසුමකට එකග වී ඇත. එසේ තිබියදී අපගේ නඩුවක් සඳහා එකගව අදාළ පාර්ශවය සඳහා එන්තරවාසි යවා තිබියදී නඩුව සඳහා පෙනී සිටීම ප්‍රතික්ෂේප කිරීම වැරද්දක් . එම පැහැර හැරීම සම්බන්ධව අධිකරණ කොමිෂන් සභාව ආදී නීතිඥ මහත්වරුන් සම්බන්ධ ආයතන අපි දැනුවත් කළ යුතුයි. [illegible] මේ සම්බන්ධව දැනුමක් ඇති වෙනත් නී[illegible] මහතෙකු අප[illegible]ගේ ඉදිරි නඩු කටයුතු සඳහා සම්බන්ධ කර ගත යුතු බවට යෝජනා කරනවා.

ඒ අනුව කටුවන ප්‍රාදේශීය සභාවේ ඉදිරි නඩු කටයුතු සඳහා වලස්මුල්ල අධිකරණයේ නීතිඥ දයාරත්න වීරසිංහ මහතා තෝරා ගැනීම සම්බන්ධවත් ඉදිරි නඩු කටයුතු එතුමන් හට භාරදීම සම්බන්ධවත් විරෝධතා අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 9. මීද්දෙනිය පොදු වැසිකිළිය ඉදිරිපිට බිම් කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුව අනුමත කිරීම

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

මීද්දෙනිය පොදු වැසිකිළිය ඉදිරිපිට බිම් කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා සකස් කරන ලද රු.275569.39 ක ඇස්තමේන්තුව අනුව එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවත් ඒ සමඟම පොදු වැසිකිළිය ඇතුළත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කර එයද සභා අරමුදලින් ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා

සභාපතිතුමනි, පසුගිය දිනක [illegible] ශ්‍රමදානයක් පැවැත්වුවා. [illegible] ගරු සභාපතිතුමාත් මීද්දෙනිය පොදු වැසිකිළිය තිබෙන ස්ථානයට ගියා. එම ස්ථානයේ පිළිසකර කිරීම කරන්න වෙනවා.

ගරු ප්‍රා.ස.ම.එච්.ඒ.ගාමිණී සංජීව මැතිතුමා

ඒත් එක්කම ගරු සභාපතිතුමනි, මීද්දෙනිය නගරයේ ප්‍රධාන පොදු වැසිකිළියක් වන මෙය ඇතුළත විශාල ලෙස ජරාජීර්ණව පවතිනවා. පිටත කොන්ක්‍රීට් කරන ගමන්ම ඇතුළත ප්‍රතිසංස්කරණය සඳහාද ඇස්තමේන්තුවක් සකස් කරන්න කියලා යෝජනා කරනවා.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ඔව්. මේ සමඟම ඇස්තමේන්තුවක් සකස් කර ඇතුළත ප්‍රතිසංස්කරණය කරමු.

ඒ අනුව මීද්දෙනිය පොදු වැසිකිළිය ඉදිරිපිට බිම් කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා සකස් කරන ලද රු.275569.39 ක ඇස්තමේන්තුව අනුව එය සභා අරමුදලින් සිදු කිරීම සම්බන්ධවත් ඒ සමඟම පොදු වැසිකිළිය ඇතුළත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කර එයද සභා අරමුදලින්

ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06. කාරක සභා වාර්තා</u>

### <u>06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව -2021.12.30 වන දින හා 2022.01.10 වන දින</u>

<u>ගරු සභාපති අයි.සී. මහින්ද මැතිතුමා</u>

2021.12.30 වන දින වවුචර් අංක 01 සිට 139 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බවත් යෝජනා අංක 01හා 02 ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

| අනු අංකය | නම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 01. | විජිත සර්විස් සෙන්ටර්,කටුවන පාර,මිද්දෙනිය | ZA-2978 අංක දරනJCB යන්ත්‍රය සේවා කිරීම වෙනුවෙන් | 28370.00 |
| 02. | ජේ.එෆ්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,වලස්මුල්ල පාර,කටුවන | LK-9589 ටිපර් රථය වාර සේවා කිරීම වෙනුවෙන් | 28390.00 |
| 03. | ජේ.එෆ්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,වලස්මුල්ල පාර,කටුවන | PC-7614 කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් | 15890.00 |
| 04. | ඩබ්.ආර්.කුමාර මයා,තාක්ෂණ සේවා නිළධාරී,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 8538.75 |
| 05. | ජේ.ජී.තිළිණි හර්ෂණී මිය, තාක්ෂණ සේවා නිළධාරී,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 06. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා, තාක්ෂණ සේවා නිළධාරී,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 07. | චන්ද්‍ර ස්ටෝර්ස්,අංක 108,මහ වීදිය,අම්බලන්තොට | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය A4 80gsm jk පැකට් 100 ක් මිලදී ගැනීම | 77000.00 |
| 08. | රෝහිණී අබේනායක මිය,කෑෂල් ෆෝ යූ,කටුවන පාර,මිද්දෙනිය. | 2021 නොවැම්බර් මස පැවති මහා සභාවට සහභාගී වූ කටුවන ප්‍රාදේශීය සභාවේ ගරු මහජන නියෝජිතයින් ඇතුළු [illegible] කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන ද්‍රව්‍ය ලබා දීම<br>• ෆ්‍රයිඩ් රයිස්(බුෆේට්) 150 - රු60000.00 | |

| | | | |
|---|---|---|---|
| | | • බිත්තර බන් 40-රු2400.00<br>• කට්ලට් 100-රු 6000.00<br>• කෙසෙල් ගෙඩි 40-රු1600.00<br>• ක්‍රීම් ක්‍රැකර් 01-රු 260.00<br>• ගම් කජු 1kg-රු4200.00<br>• සර්වියට් පේපර් පැකට්01-රු 110.00<br>• වතුර බෝතල් 40-රු 1400.00 | 75970.00 |
| 09. | පී.ජී.සමන් කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 8083.00 |
| 10. | එම්.ජී.සුගත් තිලක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 6755.00 |
| 11. | ආර්.කේ.ජයරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 3312.00 |
| 12. | කේ.ආර්.නාලක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 9136.00 |
| 13. | එස්.ජේ.ඒ.ගුණරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 7225.00 |
| 14. | ජී.සමීර මධුශංක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 780[illegible].00 |
| 15. | ආර්.එච්.සේනාරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 9608.00 |
| 16. | ප්‍රභාත් ජානක සම්පත් මයා,ආදේශක මුරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 8083.00 |
| 17. | සමීර සම්පත් මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 8013.00 |
| 18. | පී.ඩී.ඩී.චමිල් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 1823.00 |
| 19. | එස්.වසන්ත කුමාර මයා,ආදේශක වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 7123.00 |
| 20. | එම්.ජී.ලලිත් නිශාන්ත මයා,බවුසර් සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 1394.00 |
| 21. | කුමාර පලිහක්කාර මයා,මැකෑනික් සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 5046.00 |
| 22. | ආර්.ජී.සුජීත් මයා,විදුලි කාර්මික, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | [illegible] |
| 23. | අයි.ජී.මංජුල මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 4339.00 |

| | | | |
|---|---|---|---|
| 24. | සී.දයාසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 4800.00 |
| 25. | ආරියරත්න මුතුකුමාරණ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 1312.00 |
| 26. | ගයාන් සමන්ත මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 3555.00 |
| 27. | ප්‍රසීන් ලක්මාල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 959.00 |
| 28. | කේ.රූපසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 4356.00 |
| 29. | විමලාවතී මිය, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 1859.00 |
| 30. | කේ.වී.පතිනායක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 2789.00 |
| 31. | පුෂ්පා වඩිවෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 6359.00 |
| 32. | ප්‍රියන්ත ඒකනායක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 6281.00 |
| 33. | කේ.ඒ.රංජිත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 2270.00 |
| 34. | කේ.කේ.ආනන්ද මයා,ආදේශක සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 4900.00 |
| 35. | කේ.ආර්.සංජීව මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 2020.00 |
| 36. | කේ.කේ.පුෂ්පාවතී මිය, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 1012.00 |
| 37. | වයි.දයානන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 3664.00 |
| 38. | කේ.ඩී.චතුරංග මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 2475.00 |
| 39. | එස්.පී.අමිල සම්පත් මයා,ආදේශක සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 1717.00 |
| 40. | කේ.කේ.රංජනී මිය, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 1841.00 |
| 41. | එම්.අමරසේරත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 3377.00 |
| 42. | ඩබ්.කේ.රෝහිත දිල්ෂාන් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 3199.00 |
| 43. | එස්.කේ.චන්දන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 3022.00 |
| 44. | කේ.එස්.චන්ද්‍රසිරි මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 10116.00 |

| | | | |
|---|---|---|---|
| 45. | ජනක පුෂ්පකුමාර මයා,ආදේශක වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 3334.00 |
| 46. | විජිත සර්විස් සෙන්ටර්,කටුවන පාර,මිද්දෙණිය | RC-5539 ට්‍රැක්ටරය සේවා කිරීම වෙනුවෙන් | 15270.00 |
| 47. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සභාවට අවශ්‍ය සීනි,තේ කොළ,හකුරු මිලදී ගැනීමට අදාලව ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම | 5000.00 |
| 48. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත, කිරම | 2021 නොවැම්බර් මස වරාපිටිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 6000.00 |
| 49. | හාන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 9136.00 |
| 50. | හාන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස ගමන් වියදම් | 14350.00 |
| 51. | අයි.ජී.මහින්ද මැණිකුමා,සභාපති, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස ගමන් වියදම් | 15000.00 |
| 52. | ඩබ්.සුභාෂිණී මිය,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් | 3600.00 |
| 53. | කවිදු දිනේෂ්ක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 6941.00 |
| 54. | ඩබ්.පී.ආර්.ධර්මරාජිත මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 8666.00 |
| 55. | කේ.ටී.එම්.රුවිර ප්‍රියංකර මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 8583.00 |
| 56. | දිමුතු සුරංග මයා,ජල සහායක, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 8515.00 |
| 57. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 24883.00 |
| 58. | එම්.එස්.සේනාරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස ගමන් වියදම් | 4990.00 |
| 59. | කේ.එච්.සේනාරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස ගමන් වියදම් | 2100.00 |
| 60. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 24830.00 |
| 61. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් | 5500.00 |
| 62. | කේ.ජී.අනුර මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් | 6200.00 |
| 63. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 24574.00 |
| 64. | ජී.එම්.නිහාල් චමින්ද මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 10816.00 |
| 65. | සරත් ලියනගේ මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 8166.00 |

| | | | |
|---|---|---|---|
| 66. | ඒ.කේ.ඒ.ශ්‍රීකාන්ත මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 7622.00 |
| 67. | එම්.ගාමිණී මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 9136.00 |
| 68. | රොෂාන් ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 7472.00 |
| 69. | මහේෂ් මධුෂංක මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 5359.00 |
| 70. | එම්.එස්.සේනාරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 4620.00 |
| 71. | සාමාන්‍යාධිකාරී, සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා හා ගබඩා කිරීම් සඳහා 2021.12.01 සිට 2021.12.13 දක්වා ඉන්ධන බිල් ගෙවීම<br>• ZA-2978-ඩීසල්-360L<br>• LK-9589-ඩීසල්-80L<br>• 252-6508-ඩීසල්-206 L<br>• RC-5539-ඩීසල්-40L<br>• LL-7399-ඩීසල්-50L<br>• BAK-9907-පෙට්‍රල්-10L<br>• PY-2590- ඩීසල්-50L<br>• RC-7796-ඩීසල්-63L<br>• PF-7414-ඩීසල්-176L<br>• RE-8995-ඩීසල්-38L<br>• 227-5870-ඩීසල්-52L<br>• LL-6446-ඩීසල්-80L<br>• MG-330-ඩීසල්-240L<br>• SNH-2011153-ඩීසල්-58 L<br>• 270-0429-ඩීසල්-40 L<br>• RE-9230-ඩීසල්-30L | 178203.00 |
| 72. | එල්.ජී.සම්පත් මයා,සසඳි මල්ටි කලෙක්ෂන්,වලස්මුල්ල පාර,මිද්දෙණිය | කටුවන ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන්<br>• වතුර වැංකි 500ml 11-රු58300.00<br>• 6×4 ප්ලාස්ටික් පැදුරු22-රු9900.00 | |

| | | | |
|---|---|---|---|
| | | • 4×3 වයිට් බෝඩ් 11-රු27500.00<br>• ප්‍රථමාධාර පෙට්ටි 11-රු13200.00<br>• වයිට් බෝඩ් පෑන් 11-රු935.00 | 109835.00 |
| 73. | සී/ස ගුණවර්ධන සහ පුද්ගලික සමාගම,මහ විදිය,අම්බලන්තොට | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම<br>• 9×4 ලිපිකවර 1000-රු1950.00<br>• 6×3 ½ ලිපිකවර 1000-රු1100.00<br>• අච්චුල් 20-රු540.00<br>• මුද්‍රිත 04 ෆයිල් කවර 150-රු 14250.00 | 17840.00 |
| 74. | සෙනෙහස් ට්‍රේඩ් කම්බයින් (පුද්) සමාගම,කල් අරඹ,කඹුරුගමුව,මාතර | ZA-2978 මැෂෝ යන්ත්‍රයට අවශ්‍ය Idler pulley 01 ක් මිලදී ගැනීම | 9828.00 |
| 75. | සෙනෙහස් ට්‍රේඩ් කම්බයින් (පුද්) සමාගම,කල් අරඹ,කඹුරුගමුව,මාතර | ZA-2978 මැෂෝ යන්ත්‍රයට අවශ්‍ය Wear pad-Top 04 ක් හා Wear pad Bottom 04 ක්මිලදී ගැනීම | 42120.00 |
| 76. | විරසිංහ හාඩ්වෙයාර්,අංක 79ඒ,මහ විදිය ,අම්බලන්තොට | සභාවේ ජල ව්‍යාපෘති සඳහා අවශ්‍ය ½' P.V.C බට මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 62000.00 |
| 77. | USB Computers ,යූ.එස්.බී.කම්පියුටර් ඇන්ඩ් කොමියුනිකේෂන්,02 කණුව, ඇඹිලිපිටිය | මිද්දෙණිය උප කාර්යාලයේ CCTV කැමරා පද්ධතිය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් | 44330.00 |
| 78. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 24910.00 |
| 79. | සචිත්‍ර දිශේෂික මයා,රියදුරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස ගමන් වියදම් | 3850.00 |
| 80. | සහන් චතුරංග මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස අතිකාල දීමනා | 5869.00 |
| 81. | එම්.එම්.අල්තාෆ් මයා,අංක 33,පළවන පටුමග,ශෙයින්ගපුර,දික්වැල්ල | 2022 වර්ෂය සඳහා බදු නිවේදනය ඉංග්‍රීසි හා දෙමළ භාෂාවලින් පරිවර්තනය කිරීම වෙනුවෙන් ගෙවීම | 30607.00 |
| 82. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021.11.16 දින පැවති පාරිසරික ප්‍රගති සමාලෝචන කමිටුවට සහභාගී වූ නිලධාරීන් සඳහා දීමනා ගෙවීම | 2500.00 |

| | | | |
|---|---|---|---|
| 83. | පළාත්භාර අධ්‍යක්ෂ (දකුණ),මාර්ග සංවර්ධන අධිකාරිය,මාතර | මිද්දෙනිය පනාමුර පාර නුන්වන පටුමග ආරම්භක ස්ථානයේ ප්‍රධාන මාර්ගය හරහා ජල නල එලීමේ ඇස්තමේන්තු මුදල හා මිද්දෙනිය-වීරකැටිය පොළ ප්‍රවේශ මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 77087.75 |
| 84. | එම්.චම්පිකා චතුරානි මිය,ආදායම් පරීක්ෂක,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 3000.00 |
| 85. | අගලකුඹුරුගොඩ ගොවි සංවිධානය,වෙලදගොඩ,කිරම | කිරම පොළ සංවර්ධනය කිරීම i අදියර 10% රඳවුම් මුදල නිදහස් කිරීම | 184298.57 |
| 86. | එකමුතු ගොවි සංවිධානය, මාපිටකන්ද, කිරම | කිරම පොළ සංවර්ධනය කිරීම ii අදියර 10% රඳවුම් මුදල නිදහස් කිරීම | 79349.31 |
| 87. | ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | කිරම උප කාර්යාලීය සුළු මුදල් පියවීම | 5000.00 |
| 88. | එම්.කේ.ටී. චතුරානි මිය,ආදායම් පරීක්ෂක,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 3000.00 |
| 89. | අධ්‍යක්ෂ ජනරාල්, මාර්ග සංවර්ධන අධිකාරිය,කෑගල්ල | ජල ව්‍යාපෘතියේ අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සඳහා මිද්දෙනිය-හුංගම ප්‍රධාන මාර්ගයේ ගෙන්ට්‍රීස් ඇට කඩය ඉදිරිපිට මාර්ගය පළුදු කිරීම සඳහා ඇස්තමේන්තු මුදල | 140350.00 |
| 90. | මාතර හාඩ්වෙයාර්,වලස්මුල්ල පාර, මිද්දෙනිය | ජල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම<br>• ½mm ප්ලේන් කූරු 03-රු 3840.00<br>• ½T බාර්.02-රු1160.00<br>• යකඩ කපන තල 03-රු300.00<br>• 12mm වෙල්ඩින් කූරු 500g-රු225.00<br>• ½ නට්20-රු300.00 | 5825.00 |
| 91. | ජී.සමීර මධුසංක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ රියදුරු වන ජී.සමීර මධුසංක මයාගේ බර වාහන රියදුරු පත්‍ර අලුත් කිරීමේ ගාස්තුව 04/2009 චක්‍රලේඛනයට අනුව ලබා දීම | 3200.00 |
| 92. | ආර්.ජී.ඩිලාන් සංජන මයා, RBIගාමන්ට්, 213/1,අරලිය උයන, කහදූආර පාර, සිවිනාමඩව,බෙලිඅත්ත | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | |

| | | | |
|---|---|---|---|
| | | • Super guard sanitizer 5L can-රු55000.00<br>• KN 95 black masks 500-රු14000.00<br>• Hand wash (ECO)500ml bottle 20-රු6200.00 | 75200.00 |
| 93. | විගණකාධිපති ගි.අ 7040064 | 2021.01.01-2021.12.31 දක්වා වූ කාලයට අදාලව කටුවන ප්‍රාදේශීය සභාවේ සිදු කරන ලද විගණනය සඳහා වූ විගණන ගාස්තු ගෙවීම | 139800.00 |
| 94. | සෙත්මසිරි ස්ටෝර්ස්(ප්‍රයිවට්) ලිමිටඩ්, රන්න පාර,අඟුණුකොළපැලැස්ස | කටුවන ආදාහනාගාරයට 2021.12.08,2021.12.11 දිනවල 37.5kg ගෑස් පිරවූ සිලින්ඩර් 09ක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම | 76167.00 |
| 95. | ජේ.ඒ.එස්.මනුරංග මයා, යහනොසය, පන්සල පාර,වැලිපිටිය | රුක්මල්පිටිය පාලුවත්ත නැමති පර්චස් 4.5 ඉඩම මැන මායිම් පෙන්වීම සඳහා | 18000.00 |
| 96. | ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | තැන්පත් ලේඛනයේ 1 තැන්පත් යටතේ සේවක ණය වාරික නිදහස් කිරීමේදී පවතින පොළිය සභා ආදායමට ලබා ගැනීම | 24507.07 |
| 97. | සාමාන්‍යාධිකාරී, බ/ස විවිධ සේවා සමුපකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා හා ගබඩා කිරීම් සඳහා 2021.12.13 සිට 2021.12.20 දක්වා ඉන්ධන බිල ගෙවීම<br>• RC-5539-ඩීසල්-40L<br>• 227-5870-ඩීසල්-94L<br>• 252-6508-ඩීසල්-87 L<br>• LK-9589-ඩීසල්-20L<br>• SNH-2011153-ඩීසල්-48 L<br>• PF-7414-ඩීසල්-129L<br>• ZA-2978-ඩීසල්-190L<br>• ZA-2978-සෙල්ටෝක්-100ml<br>• RC-7796-ඩීසල්-31L<br>• LL-7399-ඩීසල්-100L<br>• RE-8995-ඩීසල්-42L<br>• PY-2590- ඩීසල්-25L<br>• RB-3498-ඩීසල්-32L | |

| | | | |
|---|---|---|---|
| | | | 93298.00 |
| 98. | ශක්ති එන්ටප්‍රයිසස්, පල්ලේගම, ඇඹිලිපිටිය | කටුවන ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන නව කටුවන මහජන පොළෙහි විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීම සඳහා හා වයරින් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සඳහා අවශ්‍ය විදුලි උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් | 126105.00 |
| 99. | විහාරාධිපති,අගලබඩ පියසිරි හිමි, සිත්තම්ගල්ලෙන රජ මහා විහාරය,වරාපිටිය | කටුවන ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක පොළ ව්‍යාපෘතියේ වරාපිටිය පොළ භූමිය ලබා දීම වෙනුවෙන් වූ බදු කුලිය ගෙවීම(2021 පොළ ආදායමෙන් 5% ක්) | 19453.00 |
| 100 | එම්.පී.අමරසේන මයා,කටුවන ප්‍රාදේශීය සභාව | ජල මනු කියවන්නාගේ ඔක්තෝම්බර් මස ජල බිල් බෙදීමේ දී ඉන්ධන දීමනාව ලබා දීම | 1000.00 |
| 101 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූර්ණය කිරීම | 25000.00 |
| 102 | එච්.ඒ.චමින්ද වික්‍රමසිංහ මයා,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 නොවැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් | 2400.00 |
| 103 | ජේ.ඩිලාන් මයා,මිද්දෙනිය පාර,කටුවන | 2021 දෙසැම්බර් මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 7780.00 |
| 104 | එන්.පී.ස්වර්ණා,පුවත්පත් නියෝජිත,කිරම | 2021 දෙසැම්බර් මස කිරම මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 7680.00 |
| 105 | එන්.පී.ස්වර්ණා,පුවත්පත් නියෝජිත,කිරම | 2021 වරාපිටිය මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 6890.00 |
| 106 | රෝහිණී අබේනායක මිය,කැලේගේ ස්ටෝ ප්‍රු,කටුවන පාර,මිද්දෙනිය. | 2021 දෙසැම්බර් මස පැවති මහා සභාවට සහභාගී වූ කටුවන ප්‍රාදේශීය සභාවේ ගරු මහජන නියෝජිතයින් ඇතුළු පිරිසට සංග්‍රහ කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන ද්‍රව්‍ය ලබා දීම<br>• ෆ්‍රයිඩ් රයිස් 50 -රු21500.00<br>• ඔම්ලට් බන් 45-රු2700.00<br>• කට්ලට් 110-රු 6600.00<br>• ජෝසල් ගෙඩි 45-රු1800.00<br>• ක්‍රීම් ක්‍රැකර් 01-රු 280.00<br>• ගස් කජු 1kg-රු5400.00 | |

| | | | |
|---|---|---|---|
| | | • සර්වියට් පේපර් පැකට්02-රු 220.00<br>• වතුර බෝතල් 45-රු 1575.00 | 40075.00 |
| 107 | පීපල්ස් රක්ෂණ සමාගම,කෑගල්ල | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන 19 ක් සඳහා පූර්ණ හා තෙවන පාර්ශවීය රක්ෂණාවරණය 2020.01.01-2021.12.31 දක්වා වූ කාල සීමාවට අදාළව ගෙවීම | 292698.48 |
| 108 | එම්.එස්.එම්.විජේරත්න මයා,අංක 98/6,පඹුරාව,වලස්මුල්ල | සභාව සතු ඔරුව අලුත්වැඩියා කිරීමට අදාළව ගෙවීම් කිරීම | 185000.00 |
| 109 | කේ.සී.සුජිත් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | ආදාහනාගාර ක්‍රියාකරුවන්ට හා සහයකයින්ට විශේෂ දීමනාව ගෙවීම | 7500.00 |
| 110 | සරත් ලියනගේ මයා, කටුවන ප්‍රාදේශීය සභාව | ආදාහනාගාර ක්‍රියාකරුවන්ට හා සහයකයින්ට විශේෂ දීමනාව ගෙවීම | 7500.00 |
| 111 | ඒ.කේ.ඒ.ක්‍රිෂාන්ත මයා, කටුවන ප්‍රාදේශීය සභාව | ආදාහනාගාර ක්‍රියාකරුවන්ට හා සහයකයින්ට විශේෂ දීමනාව ගෙවීම | 7500.00 |
| 112 | එම්.කේ.සමීර සම්පත් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | ආදාහනාගාර-ක්‍රියාකරුවන්ට හා සහයකයින්ට විශේෂ දීමනාව ගෙවීම | 7500.00 |
| 113 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | දෙහිගහමෝහා ආයුර්වේද ජංගම සායන මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය සඳහා වැය වූ පුහුණු ශ්‍රම අත්තම් හා නුපුහුණු ශ්‍රම අත්තම් ගෙවීම | 53850.00 |
| 114 | ඒ.එස්.චන්ද්‍රසිරි මයා,ඉංජිනේරු සහකාර | අඹුදම්න පාලම ඉදි කිරීම ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව ලබා ගැනීම වෙනුවෙන් | 3000.00 |
| 115 | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | අඹුදම්න පාලම ඉදි කිරීම ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව ලබා ගැනීම වෙනුවෙන් | 3000.00 |
| 116 | ඩී.ඩී.ජයනන්දන මයා,පළාත් ඉංජිනේරු | අඹුදම්න පාලම ඉදි කිරීම ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව ලබා ගැනීම වෙනුවෙන් | 5000.00 |

| | | | |
|---|---|---|---|
| 117 | ජේ.එස්.සී.කොඩිතුවක්කු මයා,දිස්ත්‍රික් ඉංජිනේරු | කටුවන ජාතික පාසල් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව ලබා ගැනීම වෙනුවෙන් | 2500.00 |
| 118 | ජී.එස්.චන්ද්‍රසිරි මයා,ඉංජිනේරු සහකාර | කටුවන ජාතික පාසල් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව ලබා ගැනීම වෙනුවෙන් | 2000.00 |
| 119 | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණික සේවා නිලධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ජාතික පාසල් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව ලබා ගැනීම වෙනුවෙන් | 2000.00 |
| 120 | ජේ.එස්.සී.කොඩිතුවක්කු මයා,දිස්ත්‍රික් ඉංජිනේරු | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම-හෙල්ලල කසල අංගනය සංවර්ධනය ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව ලබා ගැනීම වෙනුවෙන් | 2500.00 |
| 121 | ජී.එස්.චන්ද්‍රසිරි මයා,ඉංජිනේරු සහකාර | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම-හෙල්ලල කසල අංගනය සංවර්ධනය ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව ලබා ගැනීම වෙනුවෙන් | [illegible] |
| 122 | ඩබ්.ආර්.කුමාර මයා,තාක්ෂණික සේවා නිලධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම-හෙල්ලල කසල අංගනය සංවර්ධනය ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව ලබා ගැනීම වෙනුවෙන් | 2000.00 |
| 123 | අගලකුඹුරුගොඩ ගොවි සංවිධානය,වෙළදගොඩ,කිරම | කිරම බස් නැවතුම්පොළ නින්ත අංගල්ප කිරීම<br>• 10% රඳවුම් මුදල- රු66277.17 | 596494.51 |
| 124 | කේ.එච්.ගුරුසිංහ මයා,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය-කටුවන. | 2021 වර්ෂය සඳහා උඩුගොමඩිය මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ 1980 අංක 26 දරණ ආහාර පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 2390.00 |
| 125 | ඩී.එස්.එස්.මධුෂංක මයා,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය-කටුවන. | 2021 වර්ෂය සඳහා කටුවන මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ | |

| | | | |
|---|---|---|---|
| | | 1980 අංක 26 දරණ ආහාර පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 2390.00 |
| 126 | විමලරත්න කොඩිතුවක්කු මයා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය-කටුවන. | 2021 වර්ෂය සඳහා කල්වත්ත මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ 1980 අංක 26 දරණ ආහාර පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 2390.00 |
| 127 | පී.ජී.චන්දිම පෙරේරා මයා,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය-කටුවන. | 2021 වර්ෂය සඳහා කරමැටිය මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ 1980 අංක 26 දරණ ආහාර පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 2390.00 |
| 128 | ඩී.කේ.අබේසිරිවර්ධන මයා,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය-කටුවන. | 2021 වර්ෂය සඳහා මිද්දෙනිය මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ 1980 අංක 26 දරණ ආහාර පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 2390.00 |
| 129 | ඩී.කේ.අබේසිරිවර්ධන මයා,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය-කටුවන. | 2021 වර්ෂය සඳහා මිද්දෙනිය මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ 1980 අංක 26 දරණ ආහාර පනත ක්‍රියාත්මක කිරීම සඳහා ආහාර සාම්පල් ලබා ගැනීම | 735.00 |
| 130 | පී.ජී.චන්දිම පෙරේරා මයා,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය-කටුවන. | 2021 වර්ෂය සඳහා කරමැටිය මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ 1980 අංක 26 දරණ ආහාර පනත ක්‍රියාත්මක කිරීම සඳහා ආහාර සාම්පල් ලබා ගැනීම | 2195.00 |
| 131 | ඩී.එස්.එස්.මධුශංක මයා,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය-කටුවන. | 2021 වර්ෂය සඳහා කටුවන මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ 1980 අංක 26 දරණ ආහාර පනත ක්‍රියාත්මක කිරීම සඳහා ආහාර සාම්පල් ලබා ගැනීම | 4228.00 |
| 132 | විමලරත්න කොඩිතුවක්කු මයා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය-කටුවන. | 2021 වර්ෂය සඳහා කල්වත්ත මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ | |

| | | | |
|---|---|---|---|
| | | 1980 අංක 26 දරණ ආහාර පනත ක්‍රියාත්මක කිරීම සඳහා ආහාර සාම්පල් ලබා ගැනීම | 3435.00 |
| 133 | ජේ.එච්.ගුරුසිංහ මයා,සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය-කටුවන. | 2021 වර්ෂය සඳහා උඩගොමඩිය මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ 1980 අංක 26 දරණ ආහාර පනත ක්‍රියාත්මක කිරීම සඳහා ආහාර සාම්පල් ලබා ගැනීම | 2790.00 |
| 134 | ජේ.එස්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,වලස්මුල්ල පාර,කටුවන | 227-5870 අංක දරන වෑන් රථය සේවා කිරීම වෙනුවෙන් වැය වූ මුදල් ගෙවීම | 15770.00 |
| 135 | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2021.12.10 පැවති සැලසුම් කමිටුවට අදාල දීමනාව ගෙවීම | 4500.00 |
| 136 | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2021.12.30 පැවති සැලසුම් කමිටුවට අදාල දීමනාව ගෙවීම | 5250.00 |
| 137 | ජී.පී.එච්.ප්‍රියන්ත මයා,මහින්ද සයිකල් ස්ටෝර්ස්,ජනප්‍රිය බිල්ඩිංග්ස්,වීරකැටිය පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභා ප්‍රධාන ජල බලාගාරයේ පැනල් බෝඩ් අළුත්වැඩියාව සඳහා ගෙවීම කිරීම | 16700.00 |
| 138 | නිව ඔයිමන් ඉලෙක්ට්‍රිකල්ස්,පළමු පටුමග,වීරකැටිය පාර,වලස්මුල්ල | කටුවන ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජල බලාගාරයේ ජල මෝටර් අළුත්වැඩියාව (25ත්‍රිෆේස් මෝටරය කොයිල් එතීම) සඳහා ගෙවීම | 75000.00 |
| 139 | එම්.දිනුෂිත් රත්නුල මයා,ලේකම්,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |

ඉහත වවුචර් අංක 01 සිට 139 දක්වා වූ වවුචර් ගෙවීම කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

1) කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය සියුම් පයිප්ප ප්‍රසම්පාදන තීරණ අනුව එම්.ජේ.ජී.කොන්ක්‍රීට් වර්ක්ස් ආයතනයෙන් පහත මිල ගණන් යටතේ මිලදී ගැනීමට අවශ්‍ය බව ගයාන් සංජීව මහතා විසින් දැනුම් දී ඇත.

| අනු අංකය | මිලදී ගැනීමට අවශ්‍ය සියුම් පයිප්ප ප්‍රමාණය | අවශ්‍ය සියුම් පයිප්ප සංඛ්‍යාව | ඒකක මිල | මුදල | ප්‍රවාහනය ගාස්තුව |
|---|---|---|---|---|---|
| 01 | 2×8 සියුම් පයිප්ප | 70 | 15290.00 | 1070300.00 | 75000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02 | 3×8 සිසුම් පයිප්ප | 24 | 24090.00 | 578160.00 | 60000.00 |
| මුළු මුදල | | | | | 1783460.00 |

ඉහත මිල ගණන් යටතේ සිසුම් පයිප්ප මිලදී ගැනීමට සුදුසු බව යෝජනා විය.

2] 2021 වර්ෂයේ ඇස්තමේන්තු ගත ආදායම ඉක්මවූ ආදායම් සඳහා පරිපූරක අයවැයක් ගරු.සභිකු උදාර මහතා විසින් පහත පරිදි ඉදිරිපත් කර ඇත.

| අනු අංකය | අය ශීර්ෂය | විස්තරය | 2021 වර්ෂයට ඇස්තමේන්තු ගත ආදායම | 2021.11.30 දිනට ලැබූ ආදායම | අය වැය ඉක්මවා ලද මුදල | පෙර පරිපූරක ලෙස ගත් මුදල | පරිපූරක අය වැය ලෙස අනුමැතියට ඉදිරිපත් කරන මුදල |
|---|---|---|---|---|---|---|---|
| 1 | 1/65 | වෙනත් සේවා සඳහා ගාස්තු(වෙනත් ආදායම්) | 20000.00 | 70913.00 | 50913.00 | - | 50900.00 |
| 2 | 2/36 | පාරිසරික බලපත්‍ර | 250000.00 | 316000.00 | 66000.00 | - | 66000.00 |
| 3 | 2/44(i) | සේවා සඳහා ගාස්තු(පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ස්ථාන පරීක්ෂණ ගාස්තු) | 40000.00 | 45000.00 | 5000.00 | - | 5000.00 |
| 4 | 3/25 | වාහන උපකරණ කුලියට දීම | 800000.00 | 844940.00 | 44940.00 | - | 44900.00 |
| | | | | | | එකතුව | 168800.00 |

204(i)වාහන යන්ත්‍ර සූත්‍ර උපකරණ අළුත්වැඩියා කිරීම ශීර්ෂයට ඉහත සඳහන් මුදල පරිපූරකයක් ලෙස ඉදිරිපත් කිරීමට සුදුසු බව ද යෝජනා විය.

ගරු ප්‍රා.ස.ම. ටී.බී.ඉන්දික මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

2022.01.10 වන දින වවුචර් අංක 01 සිට 70 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බවත් යෝජනා අංක 01 හා 02 ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

| අනු අංකය | නම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 01 | සරසවි බුක්ෂොප් ප්‍රයිවට් ලිමිටඩ්,මහර | සභා තීරණ අනුව ස්වර්ණ පුස්තක හා රජය සම්මාන දිනූ 2021 වර්ෂයේ එළි දැක්වූ කෘති මිලදී ගැනීම | 57720.00 |

| | | | |
|---|---|---|---|
| 02. | ධර්මදාස රණතුංග මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | LK-9589 අංක දරන ජීප් රථය අධිවේගී මාර්ගය ඔස්සේ ගාල්ලට යාම සඳහා වැය වූ මුදල් ලබා ගැනීම | 600.00 |
| 03. | ඩබ්.ආර්.කුමාර මයා,තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 8538.75 |
| 04. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා, තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 05. | කේ.ජී.ඩී.හර්ෂණී මිය, තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 06. | එස්.පී.ගුණවර්ධන මයා,212,හිරන්විල ගෙදර,වලකඩකන්ද,වතුකන්ද,කටුවන | 2022 වර්ෂයට මිද්දෙනිය බස්නැවතුම්පොළ පොදු වැසිකිළිය ටෙන්ඩරය ලබා ගැනීම සඳහා තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප තැන්පත් මුදල නිදහස් කිරීම | 2000.00 |
| 07. | ඩබ්.එම්.ශිවා මිය, ඩිඹිරිගහකොරටුව, රුක්මල්පිටිය, කටුවන | 2022 වර්ෂයට මිද්දෙනිය බස්නැවතුම්පොළ පොදු වැසිකිළිය ටෙන්ඩරය ලබා ගැනීම සඳහා තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප තැන්පත් මුදල නිදහස් කිරීම | 2000.00 |
| 08. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ වාහන 13 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා වැය වූ මුදල් ලබා ගැනීම | 45640.00 |
| 09. | ආර්.පී.නුවන් ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් | 9719.00 |
| 10. | නීරිෂි අබේනායක මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් | 9719.00 |
| 11. | ජේ.ඒ.රංජිත් කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් | 9719.00 |
| 12. | අයි.සුනිල් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් | 9719.00 |
| 13. | එම්.ඒ.චමින්ද කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් | 4724.50 |
| 14. | කේ.කේ.ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් | 4724.50 |
| 15. | කේ.සී.සංජීව මයා,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව | 4000.00 |
| 16. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 252-6508 කැබ් රථයෙන් කාර්මාන්ත බිල්පත රැගෙන හම්බන්තොට සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යාම වෙනුවෙන් | 750.00 |
| 17. | ඩබ්.ඒ.දනිකා සුභාෂිනී මිය,අසෝකසිරි ස්ටෝර්ස්,මිද්දෙනිය | 2021 දෙසැම්බර් මස මිද්දෙනිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 6850.00 |

| | | | |
|---|---|---|---|
| 18. | එච්.ඒ.සාගරිකා මිය,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස ගමන් වියදම | 720.00 |
| 19. | ඩබ්.ඒ.වසන්ත කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | ජල බිල් බෙදීමේදී 400km ට වැඩියෙන් ධාවනය කිරීමට සිදු වීම නිසා එයට අදාළ ඉන්ධන දීමනාව ලෙස ලබා දෙන රු 1000 ක දීමනාව 2021 ඔක්තෝම්බර් හා නොවැම්බර් මාසයන්ට අදාළ දීමනාව ගෙවීම | 2000.00 |
| 20. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | ඉදිකිරීම් සනාථ කිරීම වෙනුවෙන් ඡායාරූප ලබා ගැනීමට ආර්.එම්.එස්.කේ.ආරියසේන මහතාගේ අතින් වැය වූ මුදල් ලබා ගැනීම (photo print 04) | 2000.00 |
| 21. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | ඉදිකිරීම් සනාථ කිරීම වෙනුවෙන් ඡායාරූප ලබා ගැනීමට ආර්.එම්.එස්.කේ.ආරියසේන මහතාගේ අතින් වැය වූ මුදල් ලබා ගැනීම(4R media-27) | 4050.00 |
| 22. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | ඉදිකිරීම් සනාථ කිරීම වෙනුවෙන් ඡායාරූප ලබා ගැනීමට ආර්.එම්.එස්.කේ.ආරියසේන මහතාගේ අතින් වැය වූ මුදල් ලබා ගැනීම(4R media-27) | 4050.00 |
| 23. | එල්.ඩී.ඩී.දුල්ෂානි මිය,ලක්සාන් ඇඩ්වටයිසින්,වීරකැටිය පාර,මිද්දෙනිය | කටුවන නව මහජන පොළ විවෘත කිරීමට අදාලව නිර්මාණය කර ප්‍රදර්ශනය කරන ලද පින්තරාත්මක දැන්වීම් පුවරුව නිර්මාණය කිරීම වෙනුවෙන් | 37400.00 |
| 24. | සමරසිංහ මෙටල් ක්‍රෂ්, කලාව,කාරියමඩිත්ත | කටුවන මහජන පොළෙහි ඇතිරීම සඳහා ABCකොන්ක්‍රීට් ගල් කියුබ් 2.7 මිලදී ගැනීම | 16200.00 |
| 25. | සාමාන්‍යාධිකාරී, සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා හා ගබඩා කිරීම සඳහා 2021.12.21 සිට 2021.12.31 දක්වා ඉන්ධන බිල ගෙවීම<br>• 227-5870- ඩීසල්-123L<br>• PF-7414-ඩීසල්-257L<br>• MG-330-ඩීසල්-240L<br>• ZA-2978-ඩීසල්-370L<br>• RC-5539-ඩීසල්-80L<br>• RE-6995-ඩීසල්-70L<br>• BAK-9907-පෙට්‍රල්-20L<br>• 252-6508-ඩීසල්-211 L<br>• 252-6508- එන්ජින් ඔයිල්-1 L | |

| | | | |
|---|---|---|---|
| | | • RB-3498- ඩීසල්-41 L<br>• ගබඩාව-පෙට්‍රල්-20L<br>• Py-2590- ඩීසල්-75 L<br>• Py-2590- එන්ජින් ඔයිල්-2 L<br>• LL-6446-ඩීසල්-105L<br>• SNH-2011153-ඩීසල්-80 L<br>• LK-9589-ඩීසල්-85L | 219057.00 |
| 26. | ජී.එම්.නිශාල් චමින්ද මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | පැය 80 ට වඩා වැඩි 2021නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම කිරීම | 6761.00 |
| 27. | ඒ.කේ.ජී.ක්‍රිශාන්ත මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | පැය 80 ට වඩා වැඩි 2021නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම කිරීම | 4335.00 |
| 28. | සරත් ලියනගේ මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | පැය 80 ට වඩා වැඩි 2021නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම කිරීම | 4237.00 |
| 29. | ප්‍රභාත් ජානක සම්පත් මයා,ආදේශක මුරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | පැය 80 ට වඩා වැඩි 2021නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම කිරීම | 505.00 |
| 30. | රොෂාන් ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | පැය 80 ට වඩා වැඩි 2021නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම කිරීම | 3970.00 |
| 31. | ඩී.ඒ.සමන් කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | පැය 80 ට වඩා වැඩි 2021නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම කිරීම | 1718.00 |
| 32. | දිමුතු සුරංග මයා,ජල සහායක, කටුවන ප්‍රාදේශීය සභාව | පැය 80 ට වඩා වැඩි2021 නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම කිරීම | 5322.00 |
| 33. | කේ.ටී.එම්.රුචිර ප්‍රියංකර මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | පැය 80 ට වඩා වැඩි 2021නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම කිරීම | 536.00 |
| 34. | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | පැය 80 ට වඩා වැඩි 2021නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම කිරීම | 7583.00 |
| 35. | එම්.දිනුෂ් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 3104.00 |
| 36. | ආර්.එම්.චින්තක ජීවනලාල් මයා, පිරිසිදුකරු,වෙළඳපොළ,කිරම | කිරම නව වෙළඳ සංකීර්ණයේ අංක 17 කඩ කාමරයේ Roller door එක කැඩී ඇති බැවින් එය පුලි යොදා සකස් කිරීම සඳහා වූ වැය වූ මුදල් ගෙවීම | 18000.00 |
| 37. | එච්.ඒ.චමින්ද වික්‍රමසිංහ මයා,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2800.00 |
| 38. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5500.00 |
| 39. | ඒ.වී.පී.යමුනා නිල්මිණි මිය, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3420.00 |
| 40. | කේ.ජී.ටී.හර්ෂණී මිය, තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5500.00 |
| 41. | එම්.චමිපිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 4000.00 |

| | | | |
|---|---|---|---|
| 42. | ඩබ්.ආර්.කුමාර මයා, තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5500.00 |
| 43. | එන්.එන්.වීරක්කොඩි මයා, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 6040.00 |
| 44. | ජේ.පී.අනුර මයා, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 6200.00 |
| 45. | ජේ.පී.සංජීව මයා, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3200.00 |
| 46. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා, තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස 29 දින ගමන් වියදම් ගෙවීම | 700.00 |
| 47. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා, තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස 30 දින ගමන් වියදම් ගෙවීම | 700.00 |
| 48. | එම්.දිනුෂ් රත්දූල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 7000.00 |
| 49. | පී.ඒ.රංජිත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 1339.00 |
| 50. | එම්.අමරසේරත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 2133.00 |
| 51. | කේ.ආර්.සංජීව මයා,ආදේශක සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 1212.00 |
| 52. | [illegible].ආනන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 4092.00 |
| 53. | වයි.දයානන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 5066.00 |
| 54. | සුජිත් ලක්මාල්, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 1869.00 |
| 55. | එම්.ඒ.සුගත් තිලක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 2577.00 |
| 56. | කුමාර පලිහක්කාර මයා,බැකෝ සහායක, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 7968.00 |
| 57. | එම්.ඒ.ලලිත් නිශාන්ත මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 1019.00 |
| 58. | එස්.වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 7931.00 |
| 59. | ප්‍රසාත් ජනක සම්පත් මයා,ආදේශක මුරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 7881.00 |
| 60. | ජනක පුෂ්පකුමාර මයා, ආදේශක වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 2121.00 |
| 61. | ජේ.ජේ.ජයරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 7195.00 |

| | | | |
|---|---|---|---|
| 62. | බී.ඒ.සමන් කුමාර මයා, ආදේශක වැඩ ක්ෂේත්‍ර කම්කරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා | 8588.00 |
| 63. | එස්.එච්.චන්දනා මයා,සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය,වලස්මුල්ල | 2021 වර්ෂයේ ආහාර සාම්පල් ලබා ගැනීම වෙනුවෙන් වැය වූ මුදල් ගෙවීම | 2650.00 |
| 64. | ජේ.ජී.කුලරත්න මයා, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය,වලස්මුල්ල | 2021 වර්ෂයේ ආහාර සාම්පල් ලබා ගැනීම වෙනුවෙන් වැය වූ මුදල් ගෙවීම | 1915.00 |
| 65. | පී.ඒ.නිල් ලක්මාල් මයා, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය, වලස්මුල්ල, | 2021 වර්ෂයේ ආහාර සාම්පල් ලබා ගැනීම වෙනුවෙන් වැය වූ මුදල් ගෙවීම | 3185.00 |
| 66. | මහාමේපේරි ස්ටෝර්ස් පුද්ගලික සමාගම,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් කසල පාලන යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට උපකරණ මිලදී ගැනීම | 30269.00 |
| 67. | ග්ලෝබල් ජී.අයි.එස්.ප්‍රයිවට් ලිමිටඩ්, නො.58,පාගොඩ පාර,නුගේගොඩ | කටුවන ප්‍රාදේශීය සභාවට Pentex Automatic level AP230 (ලෙවෙල් මැශිම)මිලදී ගැනීම වෙනුවෙන් | 78000.00 |
| 68. | ඩබ්.සුහාෂිණී මිය, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 4800.00 |
| 69. | එන්.ජී.ජී.ඉන්දික මයා, පන්නිමුල්ල, පනාගොඩ, තෙළුව, ගාල්ල | කුලී පදනම මත කටුවන ප්‍රාදේශීය සභාවේ රාජකාරි කටයුතු සඳහා යොදා ගැනීමට ලබාගත් SP-PY-2590 දරණ ඩිමෝ බට්ටා වාහනය සඳහා මාසික කුලී මුදල ගෙවීම(දෙසැම්බර් මාසය සඳහා) | 40000.00 |
| 70. | සෝමසිරි ස්ටෝර්ස් පුද්ගලික සමාගම,රන්න පාර, අඟුණුකොළපැලැස්ස | 2021.12.29 දින කටුවන ආදාහනාගාරය වෙනුවෙන් මිලදී ගත් 37.5kg ගෑස් සිලින්ඩර් 06 ක් මිලදී ගැනීම වෙනුවෙන් | 50778.00 |

ඉහත වවුචර් අංක 01 සිට 70 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

01. මිද්දෙනිය බස්නැවතුම්පල පොදු වැසිකිලියේ 2021 වර්ෂය ටෙන්ඩරය කංකානම් ගෙදර,වකුකන්ද,කටුවන ලිපිනයේ පදිංචි ඩබ්.කේ.දහනායක මයා විසින් ලබා ගෙන ඇත. පොදු වැසිකිළියේ නඩත්තු කටයුතු නිසි පරිදි පවත්වාගෙන නොයෑම හේතුවෙන් 2021.07.20 දින ගිවිසුම අවලංගු කරන ලදී.ඔහුගෙන් අය විය යුතු සියලු හිඟ මුදල් ඔහු විසින් තැන්පත් කරන ලද 25% ආරක්ෂිත ඇප තැන්පත් මුදලින් අය කර ගන්නා ලෙස 2021.08.10 පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී නිර්දේශ වී ඇත.එහෙත් ඔහුගේ ආරක්ෂිත ඇප තැන්පත් මුදල සියළු හිඟ මුදල් පියවීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් 2019.11.10 දින 5063 අංක දරන ලදුපතින් තැන්පත් කර ඇති ටෙන්ඩර් ඇප තැන්පත් මුදල වන රු2000.00 හා 2021.01.08 දින 6590 අංක දරන ලදුපතින් තැන්පත් කර ඇති ටෙන්ඩර් ඇප තැන්පත් මුදල වන රු2000.00 දයොදා ගෙන එම හිඟයන් පියවීම සුදුසු බව ආදායම් විෂයභාර නිළධාරිණිය විසින් යෝජනා කර ඇති අතර එම හිඟ මුදල් ටෙන්ඩර් ඇප තැන්පතු මුදල්ද යොදා ගෙන පියවීමටත් ඉතිරියක් වේ නම් අදාළ පුද්ගලයා වෙත ගෙවීමටත් සුදුසු බව යෝජනා විය.

02. කටුවන ප්‍රාදේශීය සභාවේ වරිපනම් ප්‍රතිශෝධන කටයුතු 2020 සැප්තැම්බර් මස සිට කරගෙන යනු ලබන අතර තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට සහය ලබා දීම සඳහා ජී.ආර්.රශ්මි රවීනා මෙනවිය තාවකාලිකව සහභාගී කරවන ලදී.ඒ අනුව ඇය විසින් සේවය කරන ලද කාලය සඳහා දිනකට රු 1600.00 බැගින් ගෙවීම් කිරීම සඳහා තාක්ෂණ නිලධාරී විසින් නිර්දේශ කර ඇති අතර ඒ සඳහා අදාල අනුමැතිය ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කරන ලදී.සේවාව ලබා ගත් කාර්යාලය මගින් ඇයගෙන් සේවාව ලබා ගත් බවට සහතික කර ගත යුතු බවට හා දිස්ත්‍රික් මිල කමිටු දෛනික දීමනා නොඉක්මවන පරිදි මහා සභාවට යොමු කර සාධාරණීකරණ කර ගෙවීමට යටත්ව එක් අංශෙකු,1987 අංක 15 ප්‍රාදේශීය සභා පණතේ 19(1)(i) වගන්ති ප්‍රකාරව සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ඇයගේ සේවය 2020 සැප්තැම්බර් මස 03 වන දින සිට 2021 අප්‍රේල් මස 29 දින දක්වා ලබා ගත් බව තක්සේරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ තක්සේරු(වැ.බ) ගේ අංක තම/305/1/කටු/2017 හා 2022.01.07 දිනැති ලිපිය මගින් සහතික කර ඇත.එම නිසා ඇය විසින් සේවය කරන ලද දින 102 ක් සඳහා දිනකට රු 1600.00 බැගින් රු 163200.00 ගෙවිය යුතු බව දීප චාන්දනී මිය විසින් යෝජනා කර ඇති අතර එය ගෙවීමට සුදුසු බව යෝජනා විය.

ගරු ප්‍රා.ස.ම. ඊ.බී.ඉන්දික මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මෙම මුදල් ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ 109 සිට 112 දක්වා ආදාහනාගාර ක්‍රියාකරුවන්ට දීමනාවක් ගෙවා තිබෙනවා නේද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඔව්. කොවිඩ් මරණ ආදාහනය කිරීම සඳහා ඒ අයට දීමනාවක් ගෙවනවා. එය පළාත් සභා ප්‍රතිපාදන මගින් ප්‍රතිපූර්ණය වෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මෙම වාර්තාවේ සභාව සතු ගිරුව අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් දාලා තියෙනවා. ඒ මොකේද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඔව්. මෙම කැකිරිඔබ්බ ජලාශය ඉදිකිරීමත් සමඟ ගරු චමල් රාජපක්ෂ මැතිතුමන් විසින් මුදල් ප්‍රතිපාදන ලබා දීලා ජලාශයට යට වීම නිසා පුස්කොළයාය වෙළඳගොඩ මාර්ගය නොමැති නිසා මේ අඟුල සභාව සතු දේපලක් විදියට ලබා දුන්නා. පසුව මෙය කවුරුන් හෝ මේ කඩලා වතුරේ ගිල්වා තියෙද්දි සොයා ගත්තා. ඒ සඳහා නඩුවක් ගොනු කරලා වැරදි කරුවන් සොයා ගෙන නැවතත් සභාව සතු දේපලක් මෙය නඩත්තු කිරීමට මේ සඳහා අය කර ගත් මුදල් සභාව වෙත එවා තිබුණා. ඒ මුදලින් තමයි මේ නඩත්තු කටයුත්ත කළේ. දැනට සභාව විසින් මේ සඳහා කමිටු පත් කරන්න අවශ්‍යයි.

<u>ගරු ප්‍රා.ස.ම.එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

මෙම වාර්තාවේ අංක 123 කිරම බස් නැවතුම්පොළ තීන්ත ආලේප කිරීම සඳහා රැඳවුම් මුදල් ගෙවලා තියෙනවද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

රැඳවුම් මුදල් ගෙවන්න කාලයක් වුණේ නැහැ. මෙහි ගෙවූ මුදල රු.596494.51ක් වෙනවා. එහි රැඳවුම් මුදල් ලෙස රු.66277.17ක් ඉතිරි කර ගෙන තියෙනවා. ඒත් එක්කම පරිපූරක අයවැයක් සහ හියුම් පයිප්ප මිලදී ගැනීම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවක් දක්වා තියෙනවා. ඒකත් ඔබ සමග බලන්න.

<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

මෙම හියුම් පයිප්ප මිලදී ගැනීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේදී මෙය මිල කැඳවීම කිරීමෙන් පසුව මිල ඉහළ ගොස් තිබෙනවා. එම ආයතනයෙන් අපිට දැනුම් දුන් පරිදි දින 14ක් තුළ මිලදී ගැනීම කළහොත් එම මිල ගණන් යටතේම ලබා දෙන බව කියූ නිසා ඒ සඳහා ඉදිරි මහා සභා අනුමැතියට යටත්ව අවශ්‍ය කටයුතු කරන්න අපි පසුගිය මුදල් කමිටුවේදී තීරණය කළා.

<u>ගරු ප්‍රා.ස.ම.එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

දැනට මේ හියුම් පයිප්ප සියල්ල අපිට ලැබිලා තියෙනවද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

හියුම් පයිප්ප කොටසක් ලැබිලා තියෙනවා. කිරම කාර්යාලයේ තමයි ඒ ටික තියෙන්නේ. ඔබතුමන්ලා අවශ්‍ය ස්ථාන කොට්ඨාශ මට්ටමින් දැනුම් දෙන්න. ඒත් එක්කම අපේ ඇතැම් ආදායම් ලැබීම් ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා වැඩි වීම නිසා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා තියෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

මෙම දෙවන මුදල් කමිටු වාර්තාවට අනුව ඉදිරිපත් කර ඇති යෝජනා අතර දෙවන යෝජනාවෙහි දක්වා තියෙන්නේ වරිපනම් ප්‍රතිශෝධන කටයුතු සඳහා සභාවට යොදා ගන්නා ලද අය වෙනුවෙන් කරන ලද ගෙවීම් සම්බන්ධව . මේ අය කාර්මික ආයතන වලින් ඉගනුම ලැබූ පුහුණු ලාභීන්ද? මෙම ගෙවන මුදල තීරණය කරන්නේ කුමන පදනමකින්ද? ඒත් එක්කම අපි වරිපනම් බදු අය කිරීම සඳහා පවතින ක්‍රමවේදය කොහොමද? ඒ සඳහා අවශ්‍ය වැඩ කටයුතු සිදු කරලා තියෙනවද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මෙම පුද්ගලයා කාර්මික ආයතනයකින් මෙහෙට පුහුණුව සඳහා එවන ලද ළමයෙක්. අදාළ පුහුණු කාල සීමාවෙන් පසුව මෙම වරිපනම් කටයුතු සඳහා යොදා ගත්තා. එම ගෙවන මුදල තීරණය කළේ දිස්ත්‍රික් මිල කමිටුව මගින්. මෙම ගෙවීම සඳහා පළාත් පාලන කොමසාරිස් මගින් අනුමැතිය ලබා

ගෙන තියෙනවා,වරිපනම් තක්සේරු කටයුතු කොවිඩ් වසංගත තත්වයත් එක්ක නතර වුණා. ඒ සම්බන්ධයෙන් ඉක්මණින් නැවත කටයුතු ආරම්භ කරනවා.

ඒ අනුව 2021.12.30 පැවැත්වූ මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අංක 01 සිට 139 දක්වා වූ වවුචර් ගෙවීම සම්බන්ධවත් අංක 01 සහ 02 යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් 2022.01.10 පැවැත්වූ මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අංක 01 සිට 70 දක්වා වූ වවුචර් ගෙවීම සම්බන්ධවත් අංක 01 සහ 02 යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් විරුද්ධ අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රිවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 – 2. මාසික වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව - 2021 දෙසැම්බර් මස</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2021 වර්ෂයේ දෙසැම්බර් මස මහ සභාව සතු සියළු වෙළඳ පොළවල් , මිද්දෙනිය පොළ තුළ පිහිටි වෙළඳ කුටිවලින් හා මිද්දෙනිය පැරණි පොළ මාළු ලැලි මගින් රු.538900.00ක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ව්‍යාපෘති දීමනා වෙනුවෙන් රු. 58325.00ක් වියදම් වූ අතර ශුද්ධ ආදායම රු.480575.00 ක් වන අතර මෙම වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජී.පී.නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඒක් ඒක්කම අළුපොත්දෙනිය පොළ නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න නිශාන්ත මන්ත්‍රීතුමන්ට කිව්වා. ඉදිරියේදී පොළ පටන් ගන්න ඒ අවශ්‍ය කටයුතු සූදානම් කරන්න.එය ජනතාවට විශාල සේවාවක් සැපයූ තැනක්.

ඒ අනුව 2021 දෙසැම්බර් මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රිවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 – 3. ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව - 2021 දෙසැම්බර්</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සදහා දෙසැම්බර් මස රු.490558.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. පී.කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2021 දෙසැම්බර් මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විරුද්ධ අදහස් නොමැති බැවින් සියලු මන්ත්‍රීතුමන්ලාගේ ඒකගතාවය මත සභා සම්මත කරන ලදි.

## <u>06 - 4 .ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව - 2021 නොවැම්බර් මස</u>

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

2021 නොවැම්බර් මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු: 3544934.74 ක් වන අතර මාසික වියදම රු.4041407.19ක් වේ. ඒ අනුව මාසික අලාභය රු: 496472.45 කි. ඒ අනුව නොවැම්බර් මාසයට අදාළ ජල විශ්ලේෂණ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021 නොවැම්බර් මස ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

06 - 5. ජල ව්‍යාපෘතියේ මාසික ජල හිඟය අඩු වැඩි වීම -2021 නොවැම්බර් මස

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

කටුවන ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘතියට අදාළව මාසික ලැබීම් සහ හිඟ මුදල් සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2021 නොවැම්බර් මස වන විට ආරම්භක හිඟය රු: 8926199.97ක් වන අතර නොවැම්බර් මස අවසාන හිඟය රු: 8593779.97ක් වේ. ඒ අනුව හිඟය අඩු වී ඇති අතර එහි වෙනස රු: 332420.00කි. මෙම වාර්තාව සභා සම්මත කර ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

මිද්දෙනිය පන්සලේ ජල හිඟය විශාල වශයෙන් පවතිනවා. ඒ සඳහා තීරණයක් ගන්න වෙනවා. කොට්ඨාශයේ සිටින මන්ත්‍රීතුමන්ලා ඒ සඳහා යෝජනා කරන්නේ කුමක්ද?

ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්. ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා

ගරු සභාපතිතුමණි, අපි මේ සඳහා තවත් එක් අවස්ථාවක් අරගෙන විහාරාධිපති ස්වාමීන් වහන්සේ සමග සාකච්ඡාවක් පවත්වමු.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.ඒම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා

ඔව්, මමත් ඒ කථාවට එකග වෙනවා. අපේ ගරු සභාවේ මන්ත්‍රීතුමන්ලා හතර දෙනෙක් මිද්දෙනිය පුරාණ විහාරස්ථානය හා සෘජුවම සම්බන්ධ වෙනවා. වත්මන් විහාරාධිපති ස්වාමීන් වහන්සේ හා දායක සභාවේ කිහිපදෙනෙක් එක්ව අපි මේ සඳහා සාකච්ඡාවක් කැදවමු. මෙම ජල බිල් හිඟය ගරු ආන්ඩුකාර අනුමැතියට යවලා ඉවත් කිරීමට නොහැකි නම් අනිවාර්යෙන්ම ගෙවන්න තමයි තියෙන්නේ. ඒ නිසා අපි නිහිමිය පැත්තට යොමු වෙන්න අවශ්‍ය නැහැ. මෙය වත්මන් විහාරාධිපති

ස්වාමීන් වහන්සේ විසින් සමතයකට පත් කරන්න අවශ්‍ය කටයුතු කරන බවට මට විශ්වාසයක් තියෙනවා , අපි ඒ සදහා කඩිනමින් සාකච්ඡාවක් කැදවමු.

<u>ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා</u>

මේ ජල හිගය සදහා සභාවක් විදියට අපි තීරණයක් නොගතහොත් අපිට අධිකාර වෙන්න පුළුවන්. මේ හිගය සදහා විසදුමක් ලබා ගන්නා තෙක් මාසික ජල බිල හරි ගෙවන්න කියලා දැනුවත් කරන්න අවශ්‍යයි.

<u>ගරු සභාපති අයි.පී. මහින්ද මැතිතුමා</u>

අපි මේ සදහා කඩිනමින් සාකච්ඡාවක් කැදවමු. ඒ බව විහාරාධිපති ස්වාමීන් වහන්සේ දැනුවත් කරමු. අපේ සභාව නියෝජනය කරමින් පහත කමිටුව පත් කරමු.

01ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා

02.ගරු ප්‍රා.ස.ම. ඩබ්,එච්.ඒ. සහන් චන්ද්‍ර කුමාර් මැතිතුමා

03.ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමා

04.ගරු ප්‍රා.ස.ම. ශේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා

05.ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා

06.ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා

07.කටුවන ප්‍රාදේශිය සභාවේ ලේකම්තුමා

08.හම්බන්තොට සහකාර කොමසාරිස් කාර්යාලයේ විමර්ශන නිළධාරිතුමිය

09.විෂය නිළධාරින්

මේ සදහා විහාරස්ථ දායක සභාවේ නිළධාරීන්ද එදිනට කැදවීමට අවශ්‍ය කටයුතු කරමු.

<u>ගරු ප්‍රා.ස.ම. ශ්‍රී ගුණාතිලකවක්කු මැතිතුමා</u>

ඒ කමිටුව සුදුසු බව මම ස්ථිර කරනවා. ජල හිගය සදහා කඩිනමින් විසදුමක් ලබා ගනිමු.

<u>ගරු ප්‍රා.ස.ම. එම්. ඩී.සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, අපි මේ ගැටළුව සම්බන්ධව දිගින් දිගටම ගරු සභාවේ කථා කළා. නමුත් විසදුමක් නොමැතිව ජල හිගය දිගින් දිගටම පැවතිම ගැටළුවක්. ඒ නිසා ඒ ඒ මාසික ජල බිල හරි විධිමත්ව ගෙවන්න කියලා පන්සලේ ස්වාමීන් වහන්සේ දැනුවත් කරන්න ඕන. ඊට පසුව මේ හිගය සදහා කළ යුත්තේ කුමක්ද යන්න ඉදිරියේදී රැස්වන කමිටුව මගින් තීරණය කරමු. ඒ බව ලිඛිතව දැනුම් දෙන්න.

<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මෙම ගැටළුව රාජ්‍ය ආයතන කිහිපයකම පවතිනවා. ඒ සම්බන්ධව ඒ ඒ ආයතන වල ප්‍රධානීන් සමග අපි සාකච්ඡා කරලා විසඳුමක් නොලැබුණහොත් අපිට අනිවාර්යයෙන්ම නීතිමය පැත්තට යන්න වෙනවා. එහෙම නැත්නම් අපිට සභාවක් ලෙස මේ සඳහා තීන්දු තීරණ නොගැනීම ගැටළුවක් වෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම. එච් කේ.ජී. ආනන්ද කුලසුන්දර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේ ගැටළුව මා දන්නා ලෙස මිද්දෙනිය මහා විද්‍යාලයේ, පන්සල, පොලිසිය, රෝහල ආදී ස්ථාන වල තිබුණා. ඔබයට යම් අධිකාරයක් වුවහොත් අපි සියලු දෙනාටම ඒ සඳහා වග කියන්න වෙනවා. ඒ නිසා මේ සම්බන්ධව හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත වාර්තා යැවිය යුතුයි. ඒත් එක්කම මිද්දෙනිය මහා විද්‍යාලයේ ප්‍රශ්නයේදී අපි ඒ ඒ මාස වල බිල සමග රු. 1000.00ක මුදලක් පාසල් සංවර්ධන සමිතිය මගින් ගෙවන වැඩපිළිවෙලක් සකස් කරලා මේ ගැටළු වලට විසඳුම් ලබා දුන්නා.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

අපි ඒ වාර්තා හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට යවලා තියෙන්නේ. මෙය ගරු ආණ්ඩුකාරතුමන්ට පවා යවලා තියනවා. නමුත් මේ අය අපි සමග ගිවිසුම් ගන වෙලා ජලය පරිහරණය කරලා තියෙනවා. ඒ නිසා ඒ අයට මේ ආදායම් අත් හරින්න කියන්න බැහැ. අපි මාස තුනකට වරක් විගණන කමිටු රැස්වීම් පවත්වනවා. ඒ සඳහා විගණන අධිකාරීතුමන් සහභාගි වෙනවා. එහිදී මේ සම්බන්ධව අපි කතා කරනවා. අපි පන්සල සමග සාකච්ඡාවෙන් පසුව අනෙකුත් රාජ්‍ය ආයතන වල ගැටළු සාකච්ඡා කරන්න ඒ අයත් කැඳවමු.

ඒ අනුව ජල ව්‍යාපෘතියේ 2021 නොවැම්බර් මස මාසික ජල බිහය අඩු වැඩි වීමේ වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

<u>07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 07 වාර්තා</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
  1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම
  2. 0077187171- මෙහෙයුම් හා හඩන්තු ගිණුම
  3. 0072633606- කර්මාන්ත ගිණුම
  4. 265-1-001-3-0020439- ජේවක ණය ගිණුම
  5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
  6. 265-1-001-2-7876595- පොළ ව්‍යාපෘති ගිණුම

ගරු ප්‍රා.ස.ම. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021 දෙසැම්බර් මස බැංකු යැසදුම් වාර්තාව හා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08. වෙනත් යෝජනා

### 08-1. මිද්දෙණිය සතිපොළ කඩ කාමර බදු මුදල් අයකිරීම සම්බන්ධව සහන ලබා දීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය සති පොළ කඩ කාමර බදු මුදල් අය කිරීම සම්බන්ධව සහන ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාය 09 හා 2022 .01.11 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපිය හා බැදේ. එහි සඳහන් පරිදි දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ අංක 4/04/09/01 හා 2021.12.31 දිනැති ලිපිය අනුව සතිපොළ කඩ කාමර මුදල් අයකිරීමට අදාළව 2021.08.21 සිට 2021.09.30 දින දක්වා සහන කාලයක් ලබා දෙන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව මිද්දෙනිය සති පොළෙහි ඇති කඩ කාමර 11 සඳහා 2021 සැප්තැම්බර් මාසයට අදාළව අත් හැරිය යුතු ආදායම ලෙස ගණනය කරන ලද රු 22000.00 ක මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත අත්හැරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මෙම පොල කඩ කාමර සඳහා පවතින ගිවිසුමට අනුව රු.250.00ක් පොළ පැවැත්වූ දිනකට අපි අය කළ යුතු වෙනවා. නමුත් මේ කාලය තුළ දින 08ක් පොළ පවත්වා නැහැ. ඒ වෙනුවෙන් අත් හරින මුදල ගණනය කරලා තියෙනවා. ගරු ආණ්ඩුකාර තුමන්ගේ අනුමැතිය මත එය අත් හරින්න පුළුවන්.

**ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා.**

පොළ පවත්වා නැත්නම් ඒ මුදල් අපිට අය කරන්න බැහැ.

ඒ අනුව මිද්දෙනිය සති පොළෙහි ඇති කඩ කාමර 11 සඳහා 2021 සැප්තැම්බර් මාසයට අදාළව අත් හැරිය යුතු ආදායම ලෙස ගණනය කරන ලද රු 22000.00 ක මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත අත්හැරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

### 08-2. 2022 වර්ෂයේ i කාර්තුවට අවශ්‍ය කරන ඖෂධ ඇණවුම් කිරීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

2022 වර්ෂයේ I කාර්තුවට අවශ්‍ය කරන ඖෂධ ඇනවුම් කිරීම මැයෙන් 2022.01.12 දිනැතිව රජයේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ආයුර්වේද වෛද්‍යතුමන් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ඉල්ලුම් කර ඇති ඖෂධ වර්ග අදාළ ප්‍රමාණයන්ගෙන් යුතුව සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

ඒත් එක්කම අපි දෙහිගහහේන ආයුර්වේද මධ්‍යස්ථානය ළඟදීම ආරම්භ කරනවා. ඒ සඳහා අවශ්‍ය කරන ඖෂධ ඇතුළත්ව තමයි මෙය සකස් කරලා තියෙන්නේ.

<u>ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. දෙහිගහහේන ආයුර්වේද මධ්‍යස්ථානයේ ආරම්භක උත්සවය වෙනුවෙන් සියලු දෙනාම සහභාගි වෙන්න කියලා මම ආරාධනා කරනවා.

ඒ අනුව 2022 වර්ෂයේ I කාර්තුව සඳහා රජයේ නිදහස් ආයුර්වේද වෛද්‍ය ශාලාව සඳහා ඉල්ලුම් කර ඇති ඖෂධ වර්ග අදාළ ප්‍රමාණයන්ගෙන් යුතුව සහා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-3 .2022 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

2022 වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම මහා සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම මැයෙන් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2022 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදි. මේ සැලැස්ම අනුව කටයුතු කරන්න කියමු.

ඒ අනුව 2022 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධව විරෝධී අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08- 4 .2020 ස්ථාවර වත්කම් සමීක්ෂණය සම්බන්ධව</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

2020 ස්ථාවර වත්කම් සමීක්ෂණය සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 19 හා 2022.01.19 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව අවශ්‍ය අයට බැලීමට හැකි පරිදි සකස් කරලා තියෙනවා. එය බලලා අනුමැතිය ලබා දෙන්න. අවශ්‍ය අයට පිටපතක් ලබා ගන්නත් පුළුවන්.

ඒ අනුව 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-5. කටුවන නව මහජන පොළ වෙළඳකුටි සඳහා අයකරන මුදල් සම්බන්ධව</u>**
**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

කටුවන නව මහජන පොළ වෙළඳ කුටි සඳහා අයකරන මුදල් සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 09 හා 2022.01.18 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව පහත පරිදි එම වෙළඳ කුටි මගින් මුදල් අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

**01.**ඇතුළත වෙළඳ කුටියක් සඳහා - රු.**5000.00**

**02.**එළිමහන් වෙළඳ කුටියක් සඳහා - රු.**3000.00**

ගරු ප්‍රා.ස.මන්ත්‍රී යූ.ජී ධර්මසිරි මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී යූ.ජී ධර්මසිරි මැතිතුමා</u>

අපි මේ ගාස්තු දැනට අය කරමු. ඉදිරියේදී වෙනසක් සිදු කරන්න වුණොත් බලමු.

ඒ අනුව කටුවන නව මහජන පොළ වෙළඳ කුටි මගින්

**01.**ඇතුළත වෙළඳ කුටියක් සඳහා - රු.**5000.00**

**02.**එළිමහන් වෙළඳ කුටියක් සඳහා - රු.**3000.00** ලෙස මුදල් අයකිරීම සම්බන්ධව

විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-6.</u>**<u>ඩෙංගු මර්ධන වැඩසටහනේ වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීම</u>
<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඩෙංගු මර්ධන වැඩසටහනේ වියදම් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස **11** හා **2022.01.10** දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව **2022.10.10** දින සිට **2022.01.20** දින දක්වා පවත්වනු ලබන ඩෙංගු මදුරු මර්ධන වැඩසටහන සඳහා සහභාගී වන නිළධාරීන් සඳහා අවශ්‍ය සංග්‍රහ පහසුකම් සහ එම කාලය තුළ ප්‍රාදේශිය සභාව සතු **jcb** යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බැවින් එම අදාළ කටයුතු සඳහා කුලී පදනම් මත **jcb** යන්ත්‍රයක් ලබා ගෙන ඒ සඳහා අවශ්‍ය කුලී ගෙවීම්ද සභා අරමුදලින් සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී රමණී හල්පෙගමගේ මැතිනිය යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මේ ඩෙංගු වැඩසටහන ජාතික මට්ටමින් ක්‍රියාත්මක වෙන එකක් . ඊට සමගාමීව අපි දින 10ක පමණ කාලයක් අපේ බල ප්‍රදේශයේ මීද්දෙනිය, කටුවන , හිරම, වරාපිටිය, පිස්සුබැද්ද, සියාරපිටිය , උඩගොම්බිය ආදී සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් වඩාත් ක්‍රමවත් ඩෙංගු වැඩසටහනක් සංවිධානය කළා. අපේ jcb එක මේ දින වල අක්‍රිය වෙලා නිසා අපිට මේ ඉද්ධ පවිත්‍ර කිරීම් සඳහා කුලියට යන්ත්‍රයක් ගන්න වෙනවා. ඒත් සමගම එහා නිලධාරීන් වෙනුවෙන් සංග්‍රහ කටයුතු කරන්න වෙනවා. ඒ සඳහා අයවැය මඟින් වෙන් කරන ලද මුදල් තියෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම. පී.කොඩිතුවක්කු මැතිතුමා.</u>

අපි ඒ මුදල් වලින් මේ වැඩසටහන කරමු.

ඒ අනුව 2022.10.10 දින සිට 2022.01.20 දින දක්වා පවත්වනු ලබන ඩෙංගු මදුරු මර්දන වැඩසටහන සඳහා සහභාගී වන නිලධාරීන් සඳහා අවශ්‍ය සංග්‍රහ පහසුකම් සහ එම කාලය තුළ ප්‍රාදේශීය සභාව සතු jcb යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බැවින් එම අදාළ කටයුතු සඳහා කුලී පදනම මත jcb යන්ත්‍රයක් ලබා ගෙන ඒ සඳහා අවශ්‍ය කුලී ගෙවීමද සභා අරමුදලින් සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඡන්දාවය මත ඒකමතිකව සභා සම්මත විය.

<u>08-7.අබලන් වූ මාර්ගයක් පිළිසකර කිරීම</u>
<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අබලන් වූ මාර්ගයක් පිළිසකර කර ගැනීම මැයෙන් තල්වත්ත මිහිරන්පොළ ප්‍රදේශයේ ජනතාව විසින් 2022.01.20 දිනැතිව සිදු කර ඇති ඉල්ලීම පරිදි තල්වත්ත මිහිරන්පොළ මාර්ගය ඉතා අබලන් තත්වයේ පවතින බැවින් එය තාක්ෂණ නිළධාරී මඟින් ඇස්තමේන්තුවක් සකස් කර සභා අරමුලින් සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී රමණී හල්පෙගමගේ මැතිනිය යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව තල්වත්ත මිහිරන්පොළ මාර්ගය පිළිසකර කිරීම සඳහා තාක්ෂණ නිළධාරී මඟින් ඇස්තමේන්තුවක් සකස් කර සභා අරමුදලින් සංවර්ධනය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඡන්දාවය මත ඒකමතිකව සභා සම්මත විය.

<u>08-8.වවුචර් සඳහා ගෙවීම් කිරීම</u>
<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් හදිසි නමින් ගෙවීම් කළ යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සුදුසු බව යෝජනා කරමි.

01. වවුචර් අංක 63- ST ඔටෝ රෙපෙයාරින් සෙන්ටර්,හුණුගම පාර, මිද්දෙනිය- 252-6508 කැබ් රථයේ විද්‍යුත් සම්භරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම - රු.46300.00

02.වවුචර් අංක 61 - මුදල් භාරකරු, කටුවන ප්‍රා.ස, මිද්දෙනිය - කටුවන ප්‍රා.ස අයත් වාහන 06ක් පවරා ගැනීම වෙනුවෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද මුදල - රු. 17230.00

03.වවුචර් අංක 62 - අමිල එම්බ්‍රොයිඩර්, මිද්දෙනිය - සභාව යටතේ පාලනය වන පෙර පාසල් වල ඉගනුම ලබන ළමුන් සඳහා නිළ ඇඳුම් මසා නිම කිරීමට අදාළව ගෙවීම් කිරීම - රු. 407000.00

ගරු ප්‍රා.ස.මන්ත්‍රී රමණී හල්පෙගමගේ මැතිතුමිය යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මේ සමගම මම මෝටර් ග්‍රේඩරයේ ලියාපදිංචිය සඳහා අවශ්‍ය ලේඛන සකස් කිරීම සහා අරමුදලින් කරන්න කියලා යෝජනා කරනවා . මෝටර් ග්‍රේඩරය සම්බන්ධයෙන් පසුගිය දවසක ලොකු ගැටළුවකට මුහුණ දෙන්න වුණේ මේ දේවල් නැති නිසා. මෙහි ලියාපදිංචි සහතිකය සකස් කරලා නැහැ. එය ලබා ගැනීම සඳහා අපිට දඩ මුදල් ගෙවන්න වෙයි.

<u>ගරු ප්‍රා.ස.ම. එච්.ජී.ගාමිණී සංජීව මැතිතුමා.</u>

අපි ලියාපදිංචි කරලා නැත්නම් දඩ ගෙවීමක් කරන්න වෙන එකක් නැහැ. ලියාපදිංචි කරන්න අවශ්‍ය මුදල් පමණක් ගෙවන්න වෙයි.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා.</u>

සභාපතිතුමණි, සභාව සතු සියළුම වාහන ලියාපදිංචි කරලා ඒ සඳහා අවශ්‍ය නීත්‍යානුකූල ලියකියවිලි සකස් කරන්න. එය හදිසි නමින් සභා අරමුදලින් කරලා තියන්න. එතකොට ගැටළුවක් නැහැ.

ඒ අනුව මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ වවුචර් සඳහා ගෙවීම් කිරීම සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකච්ඡන්දව සභා සම්මත විය.

<u>09.පුහු [illegible]</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ප්‍රසුගිය සභාවේ ඉල්ලුම් කළ පරිදි ආදාහනාගාරයේ ආදායම් හා වියදම් අනුව සකස් කරන ලද වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා. එය 2021 වර්ෂයට ආදාළව තමයි සකස් කරලා තියෙන්නේ. එහි වර්ෂය තුළ සිදු කරන ලද මුළු ආදාහන සංඛ්‍යාව 91ක් ලෙසත් ඉන් 07ක් නොමිලයේ ආදාහනය සිදු කළ බවත් ඒ අනුව ආදායම රු.625500.00 වන අතර වර්ෂයට අදාළව නඩත්තු කටයුතු සඳහා රු. 110000.00ක් හා ගෑස් සඳහා රු. 592232.00ක් ලෙස මුළු වියදම රු. 702232.00ක් ලෙස ගණනය කර තිබෙනවා. ඒ අනුව ගිය වර්ෂයේ ආදාහනාගාරයේ අලාභයක් තමයි සිදුව තිබෙන්නේ. ඒකට හේතුව අපි ආදාහනයන් 07ක් පමණ නොමිලයේ සිදුකර තිබෙනවා. වැඩිහිටි නිවාසයේ අය සහ ගම් වල තමන්ගේ කවුරුවත් නොමැති මිනිසුන් වෙනුවෙන් අපිට මේ සේවාව දෙන්න වෙනවා. ඒත් එක්කම නඩත්තු කටයුත්තක් සිදු කරලා තියෙනවා. පසුගිය කාලය තුළ ගෑස් මිල ඉහළ ගියා. මේ හේතු නිසා ආදාහනාගාරයේ වියදම එහි ආදායම ඉක්මවා ගොස් තිබෙනවා.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

මේ සේවාව අපි ජනතාව වෙනුවෙන් ලබා දෙන සේවාවක් නිසා ගාස්තු වැඩි කිරීමක් කරන්නත් බැහැ. අපිට ගෑස් මිල ඉහළ යන විට හෝ ඒ මුදල හරි ආවරණය කර ගන්න තියෙනවා නම් හොඳයි.

ඒත් එක්කම මීද්දෙනිය පන්සලේ ජල බිල සම්බන්ධව අපි කතා කළා. මම ඒ සම්බන්ධව ජල අංශය යටතේ පවතින තොරතුරු අරගෙන ආවා. ඒ අනුව දැනට මීද්දෙනිය විහාරස්ථානයේ හිඟ ජල බිල රු. 448882.50ක් වෙනවා. 2021 ජනවාරි මස සිට මැයි, ජූනි, ජූලි යන මාස තුනක් හැර මේ වන තෙක් ඉතිරි මාස සඳහා මාසික මුදල් ගෙවීම කරලා තියෙනවා. ඒ නිසා මට ලොකු විශ්වාසයක් තියෙනවා දැනට ඉන්න විහාරාධිපති ස්වාමීන් වහන්සේ මේ සඳහා යම් වැඩ පිළිවෙළක් යොදලා මෙය නිරවුල් කරන බවට. උන්වහන්සේ ඒ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය කොමිතාව ගෙන තියෙනවා. මේ සභාව තුළ විහාරස්ථානය හා සෘජුවම සම්බන්ධ වන අපේ ගරු මන්ත්‍රීතුමන්ලා හතර දෙනෙක් ඉන්නවා. අපි අපේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ සමග සාකච්ඡා කරලා 2022 වර්ෂය තුළ මෙම හිඟය පියවන්න කටයුතු කරන බවට මම පොරොන්දු වෙනවා. ස්තූතියි.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.බී.පුෂ්පදාස මැතිතුමා</u>.

ගරු සභාපතිතුමනි, දැනට මාර්ග සංවර්ධන කටයුතු සිදු කරනවා නේද? ඒ සඳහා සභාවේ තාක්ෂණ නිලධාරීන් මඟින් අධීක්ෂණ කටයුතු සිදු කරනවද? මේ කටයුතු ජනතාවගේ විවේචනයට ලක් නොවන විදියට සිදුකරන්න කියලා ඉල්ලීම කරනවා.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී යූ.ජී.ධර්මසිරි මැතිතුමා</u>

මේ සඳහා අපි පමණක් නොවෙයි මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරි මහත්වරු, ආර්ථික සංවර්ධන නිලධාරීන් , ග්‍රාම නිලධාරීන් ආදී කිහිප පාර්ශවයක් සම්බන්ධ වෙනවා. ඒ නිසා මේ මාර්ග සංවර්ධන කටයුතු ඒ අයගේ අධීක්ෂණයන් යටතේ විධිමත්ව සිදු වෙනවා.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඔව්. ඒ අතරේ අපේ නිලධාරීන් මේ සඳහා සම්බන්ධ වෙනවා. දැනට මාර්ග වල සංවර්ධන කටයුතු කර ගෙන යනවා. ඔබ තුමන්ලාටත් මේ සම්බන්ධව අධීක්ෂණ කටයුතු කරන්න පුළුවන්. ගැටළුවක් ඇති තැන් අපිට කියන්න.

**10. - ස්තුතිය හා නිමාව.**

අද දින 2022 වර්ෂයේ ජනවාරි මස මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා සම්බන්ධ වූ අපේ ගරු උප සභාපතිතුමන්, හිටපු ගරු සභාපතිතුමන් , ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සහ ලේකම්තුමා, නිළධාරිතුමිය, මාධ්‍යවේදීතුමන්ලා ඇතුළු සියළුම දෙනාටම ස්තුතිවන්ත වෙමින් අද දවසේ සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප.ව 1.30 ට පමණ සභා තොමෝ සතුටින් විසිර ගියහ.

.............................

අයි. පී. මහින්ද

සභාපති

කටුවන ප්‍රාදේශීය සභාව,

මිද්දෙනිය.

අයි.පී.මහින්ද
සභාපති
කටුවන ප්‍රාදේශීය සභාව
මිද්දෙනිය.